ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
இலங்கைப் பாராளுமன்றம்
**Parliament of Sri Lanka**



# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT
# 2017

වැය ශීර්ෂය
தலைப்பு } **16**
**Head**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ
இலங்கைப் பாராளுமன்றம், ஸ்ரீ ஜயவர்தனபுர கோட்டே
**Parliament of Sri Lanka, Sri Jayewardenepura, Kotte**

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**
**ශීර්ෂ අංකය 16**
**වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2017**

**පටුන**


| අංකය | විස්තරය | පිටු |
| --- | --- | --- |
| 1. | මෙහෙවර | 3 |
| 2. | ප්‍රධාන කාර්යයන් | 3 |
| 3. | සංවිධාන ව්‍යුහය | 3- 6 |
| 4. | කාර්ය මණ්ඩල තොරතුරු | 6 |
| 5. | **වාර්ෂික කාර්ය සාධනය** | |
| 5.1 | මූල්‍ය පරිපාලනය | 7 - 12 |
| 6 | ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව | |
| 6.1 | ආංශික අධීක්ෂණ කාරක සභා | 13-15 |
| 6.2 | විශේෂ කාර්යයන් සඳහා වූ කාරක සභා | |
| | (i) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව | 16 |
| | (ii) තේරීම් කාරක සභාව | 16 |
| | (iii) වරප්‍රසාද පිළිබඳ කාරක සභාව | 16 |
| | (iv) උසස් නිලතල පිළිබඳ කාරක සභාව | 16 |
| | (v) ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව | 16 |
| | (vi) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව | 17-20 |
| | (vii) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව | 20-21 |
| | (viii) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව | 21-22 |
| 6.3 | විශේෂ කාරක සභා | 22-23 |
| 6.4 | පනත් කෙටුම්පත් කාර්යාංශය | 23-26 |
| 6.5 | සභාලේඛන කාර්යාංශය | 27 |
| 6.6 | පාර්ලිමේන්තු කථා පරිවර්තක කාර්යාලය | 27-28 |
| 6.7 | පාර්ලිමේන්තු පුස්තකාලය | 28-29 |
| 7 | වේත්‍රධාරී දෙපාර්තමේන්තුව | 29-31 |
| 8 | පරිපාලන දෙපාර්තමේන්තුව | 31-33 |
| 9 | හැන්සාඩ් දෙපාර්තමේන්තුව | 33 |
| 10 | සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව | 33-34 |
| 11 | තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව | 34 |
| 12 | අභ්‍යන්තර විගණන කාර්යාංශය | 35 |
| 13 | විදේශ සබඳතා සහ සන්ධාන කාර්යාංශය | 36-37 |

**පාර්ලිමේන්තුවේ සංවිධාන ව්‍යුහය** - රූපසටහන - ( ඇමුණුම - 01 )

# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

## ශීර්ෂ අංකය - 16
## වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2017

## 1. මෙහෙවර

ව්‍යවස්ථා සම්පාදකයන්, ජනතා නියෝජිතයන් සහ රටෙහි මහජන මුදල් භාවිතය සියුම් ලෙස පිරික්සන්නන් ලෙස සිය කාර්යයන් සඵලදායී සහ වඩා කාර්යක්ෂම ලෙසින් ඉටු කිරීමේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට උපකාරී වන කාර්යය පටිපාටිමය උපදෙස් සහ පහසුකම් සැපයීම.

## 2. ප්‍රධාන කාර්යයන්

(i) ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කිරීම
(ii) රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් පූර්ණ පාලනය ක්‍රියාත්මක කිරීම
(iii) විධායකය සම්බන්ධයෙන් අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම

## 3. සංවිධාන ව්‍යුහය

ගරු කථානායකතුමා ප්‍රමුඛත්වය දරන පාර්ලිමේන්තුවේ රාජකාරි කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන ලේකම් සහ කාර්ය මණ්ඩල සේවාවන් සැපයීම පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්යමණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්යාලය පහත සඳහන් දෙපාර්තමේන්තු වලින් සමන්විත වේ.

**( සංවිධාන ව්‍යුහය සඳහා කරුණාකර ඇමුණුම 01 බලන්න )**

1. වේත්‍රධාරී දෙපාර්තමේන්තුව
2. පරිපාලන දෙපාර්තමේන්තුව
3. ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව
4. හැන්සාඩ් දෙපාර්තමේන්තුව
5. සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව
6. මුදල් හා සැපයුම් දෙපාර්තමේන්තුව
7. ආහාරපාන හා ගෘහ පාලන දෙපාර්තමේන්තුව
8. තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව

### 3.1 වේත්‍රධාරී දෙපාර්තමේන්තුව

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නියමිත වේලාවට හා කාර්යක්ෂම අයුරින් පහත දැක්වෙන සේවාවන් හැකි ඉහළම අයුරින් සැපයීම මඟින් පාර්ලිමේන්තුවේ ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා පහසුකම් සැපයීම :-

- උත්සව රාජකාරි, පාර්ලිමේන්තු සභාගර්භය තුළ විනය පවත්වාගෙන යාම, සෙංකෝලයේ භාරකාරත්වය හා ආරක්ෂාව, පාර්ලිමේන්තු ගොඩනැගිල්ලට අමුත්තන් ඇතුළු කිරීම සහ ගැලරි අධීක්ෂණය.

- පාර්ලිමේන්තු ගොඩනැගිල්ල සංරක්ෂණය සහ පාර්ලිමේන්තු සංකීර්ණය තුළ ඉඩකඩ වෙන් කිරීම.

- ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ජොෂ්ඨතා ලේඛන පිළියෙල කිරීම, පාර්ලිමේන්තු සභා ගර්භයෙහි ආසන වෙන් කිරීම සහ ආසන සැලැස්ම මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම.

## 3.2 පරිපාලන දෙපාර්තමේන්තුව

- නීති සම්පාදනය, අධීක්ෂණය හා මහජන මුදල් පාලනය උදෙසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්යභාරය සපුරාලනු වස් ඔවුන් හට කාර්යක්ෂම සහ උසස් තත්වයේ සේවයක් ලබා දීම පිණිස වඩාත් සුදුසු සාමාජිකයින් කාර්ය මණ්ඩලයට බඳවා ගැනීම, උසස් කිරීම හා විනය සම්බන්ධ කටයුතු ඇතුළුව කාර්ය මණ්ඩලයේ සියලුම අංශ වල සාමාජිකයින්ගේ දැනුම, හැකියාවන් සහ ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා මානව සම්පත් කළමනාකරණය, භාෂා ප්‍රවීණතා, පරිගණක පුහුණුව, සූපවේදී පාඨමාලා, ගිණුම්කරණ, පුස්තකාල සේවා හා අනෙකුත් විෂයානුබද්ධ දේශීය සහ විදේශීය පුහුණු පාඨමාලා සංවිධානය කිරීම සහ කාර්ය මණ්ඩලයේ ධනාත්මක ආකල්ප වර්ධනය තුලින් ඵලදායිතාවය ඉහළ නැංවීම පිණිස වැඩසටහන් සංවිධානය කිරීම සම්බන්ධ කටයුතු පරිපාලන දෙපාර්තමේන්තුවෙන් ඉටු කරනු ලැබේ.

- මීට අමතරව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සිය ධුරයන්හි කටයුතු ඉටු කිරීම සඳහා අනුමත පහසුකම් හා සේවාවන් ගුණාත්මක භාවයෙන් සහ කඩිනමින් ලබා දීමට කටයුතු කිරීමත්, පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ ප්‍රවාහනය සම්බන්ධ කටයුතු කළමනාකරණය කිරීමත් පරිපාලන දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලබයි. පහත සඳහන් කාර්යාංශ පරිපාලන දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා සිය දායකත්වය සපයයි :-

    1. ආයතන කාර්යාංශය
    2. මන්ත්‍රී සේවා කාර්යාංශය
    3. ප්‍රවාහන කාර්යාංශය.

## 3.3 හැන්සාඩ් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු රැස්වීම්, පාර්ලිමේන්තු කාරක සභා, සම්මන්ත්‍රණ, පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගම් සහ අන්තර් පාර්ලිමේන්තු සංගම් සම්මන්ත්‍රණ අපක්ෂපාතීව, නිවැරදිව හා කලට වේලාවට වාර්තා කිරීම, සුවිගත කිරීම සහ ශ්‍රව්‍ය වාර්තාකරණයන් අධීක්ෂණය සහතික කරයි.

## 3.4 සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව

- ජාතික වටිනාකමකින් යුත් සුවිශේෂී පොදු දේපළක් ලෙස පාර්ලිමේන්තු ගොඩනැගිල්ල සුරක්ෂිත කිරීම හා එය ඵලදායී සහ කාර්යක්ෂම ආකාරයෙන් නඩත්තු කිරීම හා එහි ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

- භෞතික යටිතල පහසුකම් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ කාර්ය මණ්ඩලය සඳහා නවීන පහසුකම් සහිත කාර්යක්ෂම සේවා පරිසරයක් සැපයීම.

## 3.5 ආහාරපාන සහ ගෘහ පාලන දෙපාර්තමේන්තුව

- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, කාර්ය මණ්ඩලය සහ අමුත්තන් සඳහා ගුණාත්මක භාවය සපිරි ආහාරපාන සැපයීම.
- ආපනශාලා සහ මුළුතැන්ගෙය කළමනාකරණය.
- ගොඩනැගිල්ලේ අභ්‍යන්තර හා බාහිර අලංකරණ කටයුතු, පවිත්‍රතා කටයුතු හා අනෙකුත් නඩත්තු කටයුතු .

## 3.6 මුදල් සහ සැපයුම් දෙපාර්තමේන්තුව

- අයවැය සකස් කිරීම සහ වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් එකතු කිරීම හා අයවැය පාලනය; ගිණුම්කරණය, අවසන් ගිණුම් වාර්තා සකස් කිරීම.
- පාර්ලිමේන්තුවට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම, ගබඩාකිරීම, නිකුත් කිරීම හා ප්‍රසම්පාදන කටයුතු පරිපාලනය කිරීම.
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, විශ්‍රාමික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, කාර්ය මණ්ඩලයට සහ විශ්‍රාමික කාර්ය මණ්ඩල සාමාජිකයින්ට, අනියම් සහ සහන සේවකයින්ට වැටුප් හා දීමනා ගෙවීම
- සැපයුම්කරුවන්ට හා සේවා සපයන ආයතන වලට අදාල ගෙවීම් කිරීම.

මුදල් හා සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ පහත සඳහන් කාර්යාංශ ක්‍රියාත්මක වේ:-

1. මුදල් සහ ගිණුම් කාර්යාංශය
2. සැපයුම් හා සේවා කාර්යාංශය
2. ආහාරපාන ගිණුම් කාර්යාංශය

## 3.7 ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව

නීති සම්පාදනය හා මහජන මුදල් භාවිතය අධීක්ෂණය කිරීම යන ක්ෂේත්‍රවලට අදාළ වෘත්තීමය සේවාවන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත සපයයි.

පහත සඳහන් කාර්යාංශ ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වේ:-

1. සභා ලේඛන කාර්යාංශය
2. පනත් කෙටුම්පත් කාර්යාංශය
3. කාරක සභා කාර්යාංශය - I
4. කාරක සභා කාර්යාංශය - II
5. රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා සහ රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභා කාර්යාංශය
6. මහජන පෙත්සම් කාරක සභා කාර්යාංශය
7. කථා පරිවර්තක කාර්යාලය
8. පුස්තකාලය.

## 3.8 තොරතුරු පද්ධති සහ කළමනාකරණ දෙපාර්තමේන්තුව

තොරතුරු තාක්ෂණික යටිතල පහසුකම් කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම, අන්තර්ජාල සම්බන්ධතාවන් වැඩිදියුණු කිරීම, පාර්ලිමේන්තු අන්තඃජාලය කාර්යක්ෂම හා ඵලදායි ලෙස පවත්වාගෙන යාම සහ කළමනාකරණය, පාර්ලිමේන්තුවේ වෙබ් අඩවිය පවත්වාගෙන යාම, යාවත්කාලීන කිරීම සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපකරණ නඩත්තුව මගින්;

- පාර්ලිමේන්තුවේ සියලු තොරතුරු තාක්ෂණ පාදක පරිපාලන ක්‍රියාකාරකම් ඉටු කිරීම.

**3. 9 විදේශ සබඳතා හා සන්ධාන කාර්යාංශය හා අභ්‍යන්තර විගණන අංශය සෘජුවම පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.**

## 4. කාර්ය මණ්ඩල තොරතුරු

2017 වර්ෂය සඳහා අනුමත සේවක සංඛ්‍යාව සහ දැනට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව පහත දැක්වේ

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | | | | දැනට සිටින සේවක සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පා.ම.ලේ. | ගරු. කථානායකතුමා | ගරු. නියෝජ්‍ය කථානායකතුමා | ගරු.නි.කාරක සභාපතිතුමා | පා.ම.ලේ. | ගරු. කථානායකතුමා | ගරු. නියෝජ්‍ය කථානායකතුමා | ගරු.නි.කාරක සභාපතිතුමා |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 57 | 8 | 5 | 5 | 55 | 8 | 5 | 5 |
| තෘතීය මට්ටම | 163 | 0 | 0 | 0 | 148 | 0 | 0 | 0 |
| ද්විතීයික මට්ටම | 235 | 9 | 6 | 3 | 202 | 9 | 6 | 3 |
| ප්‍රාථමික මට්ටම | 474 | 25 | 10 | 9 | 450 | 25 | 10 | 9 |
| අනියම් / තාවකාලික | 03 | 03 | 0 | 0 | 02 | 3 | 0 | 0 |
| එකතුව (2017.12.31 දිනට) | 932 | 45 | 21 | 17 | 857 | 45 | 21 | 17 |

## 5. වාර්ෂික කාර්ය සාධනය

### 5.1 මූල්‍ය පරිපාලනය - 2017 වර්ෂය සඳහාවෙන්කළ ප්‍රතිපාදන වලින් කරන ලද වියදම් :-

2017 වර්ෂයේ මෙහෙයුම් වැඩසටහන් සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් ලෙස වෙන්කරන ලද ප්‍රතිපාදන හා එම ප්‍රතිපාදන වැය කළ ආකාරය පහත දැක්වේ :-

ඩී.පී.එස්.ඒ - 1

# විසර්ජන ගිණුම 2017

අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම - පාර්ලිමේන්තුව

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහනේ අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාළ ඩී.පී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | පුනරාවර්තන | | | | | | | |
| 01 | ගරු කථානායකතුමාගේ කාර්යාලය | 168,950,000 | 47,860,000 | 0 | 216,810,000 | 200,918,831 | 15,891,169 | 3 |
| 02 | සාමාන්‍ය පරිපාලනය | 1,129,717,000 | 188,900,000 | 14,800,000 | 1,333,417,000 | 1,316,361,300 | 17,055,700 | 3 |
| 03 | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා පහසුකම් සැපයීම | 625,800,000 | 320,800,000 | -14,800,000 | 931,800,000 | 926,254,184 | 5,545,816 | 3 |
| | උප එකතුව (පුනරාවර්තන) | 1,924,467,000 | 557,560,000 | 0 | 2,482,027,000 | 2,443,534,315 | 38,492,685 | |
| | මූලධන | | | | | | | |
| 01 | ගරු කථානායකතුමාගේ කාර්යාලය | 4,500,000 | | | 4,500,000 | 2,238,669 | 2,261,331 | 4 |
| 02 | සාමාන්‍ය පරිපාලනය | 125,500,000 | 392,221,430 | 0 | 517,721,430 | 395,052,560 | 122,668,870 | 5 |
| 03 | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා පහසුකම් සැපයීම | 800,000 | | | 800,000 | 449,777 | 350,223 | 6 |
| | උප එකතුව (මූලධන) | 130,800,000 | 392,221,430 | 0 | 523,021,430 | 397,741,006 | 125,280,424 | |
| | මුළු එකතුව | 2,055,267,000 | 949,781,430 | 0 | 3,005,048,430 | 2,841,275,321 | 163,773,109 | |

පිටු අංක. 02 සිට 32 දක්වා ඩී.පී.එස්.ඒ 2 සිට ඩී.පී.එස්.ඒ 10 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක . 33 සිට 36 දක්වා ඇතුළත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් තොරතුරු හා සටහන්වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාළ ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන් දීමේ නිලධාරි
නම : ධම්මික දසනායක
තනතුර : පාර්ලිමේන්තුවේ මහ ලේකම්
දිනය: 22.03.2018
ඩබ්ලිව්. බී. ඩී. දසනායක
පාර්ලිමේන්තුවේ මහ ලේකම්
පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ.

අධ්‍යක්ෂ ( මුදල් )
නම : කේ.පී.එම්. ජයශාන්ත
දිනය : 2018.03.22
කේ. පී. මර්වින් ජයශාන්ත
අධ්‍යක්ෂ (මුදල්)
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

# වැඩසටහන් අනුව විසර්ජන ගිණුම - 2017

වියදම් ශීර්ෂ අංකය: 16
අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව
වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් කටයුතු

## පුනරාවර්තන හා මූලධන වියදම් සාරාංශය

| වියදමෙහි ස්වභාවය (ඩී.පී.එස්.ඒ ආකෘති යොමුව සමඟ) | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාළ ඩී.පී.එස්.ඒ ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| (අ) පුනරාවර්තන (ඩී.පී.එස්.ඒ. 3) | 1,924,467,000 | 557,560,000 | 0 | 2,482,027,000 | 2,443,534,315 | 38,492,685 | 3 |
| (ආ) මූලධන (ඩී.පී.එස්.ඒ. 4) | 130,800,000 | 392,221,430 | 0 | 523,021,430 | 397,741,006 | 125,280,424 | 4-6 |
| එකතුව | 2,055,267,000 | 949,781,430 | 0 | 3,005,048,430 | 2,841,275,321 | 163,773,109 | |

අධ්‍යක්ෂ( මුදල් )
දිනය:- 2018.03.22

# ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 16

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් කටයුතු

| ව්‍යාපෘති අංකය / නම, පුද්ගලික පඩිනඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අනෙකුත් වියදම් | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ව්‍යාපෘති අංකය. 01 ගරු කථානායකතුමාගේ කාර්යාලය | | | | | | |
| පුද්ගල පඩිනඩි | 60,300,000 | 22,860,000 | 840,000 | 84,000,000 | 70,864,414 | 13,135,586 |
| අනෙකුත් වියදම් | 108,650,000 | 25,000,000 | -840,000 | 132,810,000 | 130,054,417 | 2,755,583 |
| උප එකතුව | **168,950,000** | **47,860,000** | 0 | 216,810,000 | **200,918,831** | 15,891,169 |
| ව්‍යාපෘති අංක 02 සාමාන්‍ය පරිපාලනය | | | | | | |
| පුද්ගල පඩිනඩි | 737,200,000 | 151,700,000 | 0 | 888,900,000 | 874,685,682 | 14,214,318 |
| අනෙකුත් වියදම් | 392,517,000 | 37,200,000 | 14,800,000 | 444,517,000 | 441,675,617 | 2,841,383 |
| උප එකතුව | **1,129,717,000** | **188,900,000** | **14,800,000** | 1,333,417,000 | **1,316,361,299** | 17,055,701 |
| ව්‍යාපෘති අංක 03 ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් සඳහා පහසුකම් සැපයීම. | | | | | | |
| පුද්ගල පඩිනඩි | 100,000,000 | 20,000,000 | 0 | 120,000,000 | 118,100,825 | 1,899,175 |
| අනෙකුත් වියදම් | 525,800,000 | 300,800,000 | -14,800,000 | 811,800,000 | 808,153,359 | 3,646,641 |
| උප එකතුව | **625,800,000** | **320,800,000** | **-14,800,000** | 931,800,000 | **926,254,184** | 5,545,816 |
| | | | | | | |
| මුළු එකතුව | **1,924,467,000** | **557,560,000** | 0 | **2,482,027,000** | **2,443,534,314** | **38,492,686** |

අධ්‍යක්ෂ( මුදල් )

දිනය:-

බී.පී.එස්.ඒ - 4

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 16 — අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් කටයුතු

ව්‍යාපෘති අංකය හා නාමය: 01 ගරු කථානායකතුමාගේ කාර්යාලය

| වැය ඛණ්ඩ අංකය | අයිතම අංකය | මූලාශ්‍රය (සංකේත අංකය) | අයිතම විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (4-5) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | | | මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම. | | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,000,000 | 0 | 0 | 1,000,000 | 836,190 | 163,810 |
| 2002 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000 | 0 | 0 | 500,000 | 109,727 | 390,273 |
| 2003 | | 11 | වාහන | 2,000,000 | 0 | 0 | 2,000,000 | 578,112 | 1,421,888 |
| | | | | | | | | | 0 |
| | | | මූලධන වත්කම් අත්පත් කර ගැනීම. | | | | | | 0 |
| | | | | | | | | | 0 |
| 2101 | | 11 | වාහන | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 2102 | | 11 | ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ | 500,000 | 0 | 0 | 500,000 | 253,983 | 246,017 |
| 2103 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000 | 0 | 0 | 500,000 | 460,657 | 39,343 |
| | | | එකතුව | 4,500,000 | 0 | 0 | 4,500,000 | 2,238,669 | 2,261,331 |

අධ්‍යක්ෂ( මුදල් )

දිනය:-

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 16

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් කටයුතු

ව්‍යාපෘති අංකය හා නාමය: 02 සාමාන්‍ය පරිපාලනය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව

| වැය විෂය අංකය | අයිතම අංකය | මූලාශ්‍රය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මූ.රෙ.66 සහ මූ.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (4-5) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | | | **මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.** | | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,000,000 | | 0 | 1,000,000 | 895,073 | 104,927 |
| 2002 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2,500,000 | 0 | 0 | 2,500,000 | 2,072,875 | 427,125 |
| 2003 | | 11 | වාහන | 1,000,000 | 0 | 0 | 1,000,000 | 465,121 | 534,879 |
| | | | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම.** | | | | | | |
| 2101 | | 11 | වාහන | 0 | 65,221,430 | 0 | 65,221,430 | 65,221,422 | 8 |
| 2102 | | 11 | ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ | 6,000,000 | | 0 | 6,000,000 | 5,028,846 | 971,154 |
| 2103 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 10,000,000 | | 0 | 10,000,000 | 9,430,454 | 569,546 |
| | | | **මානව සම්පත් සංවර්ධනය** | | | | | | |
| 2401 | | 11 | දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 5,000,000 | 0 | 0 | 5,000,000 | 4,938,346 | 61,654 |
| 2001 | | 11 | **පාර්ලිමේන්තු සංකීර්ණය නවීකරණය** ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 100,000,000 | 60,000,000 | 0 | 160,000,000 | 140,000,423 | 19,999,577 |
| 2506 | | 11 | යටිතල පහසුකම් සංවර්ධනය | | 167,000,000 | | 167,000,000 | 167,000,000 | 0 |
| 2509 | | 11 | ආංශික අධීක්ෂණ කාරක සභා ඇතුළුව පාර්.නවීකරණය කිරීම | | 100,000,000 | | 100,000,000 | 0 | 100,000,000 |
| | | | එකතුව | 125,500,000 | 392,221,430 | 0 | 517,721,430 | 395,052,560 | 122,668,870 |

අධ්‍යක්ෂ( මුදල්)

දිනය:-

ඩී.පී.එස්.ජී - 4

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 16

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් කටයුතු

ව්‍යාපෘති අංකය හා නාමය: 03 ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන් සඳහා පහසුකම් සැපයීම

| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (4-5) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | | | මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම. | | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | | | මූලධන වත්කම් අත්පත් කර ගැනීම. | | | | | | |
| 2102 | | 11 | ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ | 300,000 | 0 | 0 | 300,000 | 141,110 | 158,890 |
| 2103 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000 | 0 | 0 | 500,000 | 308,667 | 191,333 |
| | | | එකතුව | **800,000** | 0 | 0 | **800,000** | **449,777** | **350,223** |

අධ්‍යක්ෂ ( මුදල් )

දිනය:-

**රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම :-**

2017 වර්ෂය අවසානයේදී රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමේ අනුමත සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ:-

| | **2017 අනුමත සීමා (රු.)** | **2017 තථ්‍ය අගයන් (රු.)** | |
|---|---|---|---|
| වියදම්වල උපරිම සීමා | 39,000,000 | 01601-1 | 38432250.47 |
| | | 01601-2 | 1,123,921.00 |
| ලැබීම්වල අවම සීමා | 30,000,000 | 01601-1 | 31,312,719.81 |
| | | 01601-2 | 0.00 |
| උපරිම හර ශේෂය | 175,000,000 | 130,571,436.39 | |

# 6 ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව:-

## 6.1 ආංශික අධීක්ෂණ කාරක සභා

2015 දෙසැම්බර් මස 19 වැනි දින පාර්ලිමේන්තුවේදී සම්මත වූ යෝජනාව අනුව ආංශික අධීක්ෂණ කාරක සභා 16 ක් ස්ථාපිත කර ඇති අතර ඉන් පහත දැක්වෙන ආංශික අධීක්ෂණ කාරක සභා 10 ට අදාල කටයුතු කාරක සභා I කාර්යාංශය මගින් ඉටු කරනු ලැබේ.

ඒ අනුව එක් එක් කාරක සභාව විසින් 2017 වර්ෂය තුල ඉටු කරන ලද කාර්යභාරය පහත දැක්වේ.

| | ආංශික අධීක්ෂණ කාරක සභාව | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | සළකා බැලීම් සංඛ්‍යාව | | | | පාර්ලිමේන්තුව වෙත පිළිගන්වන ලද වාර්තා සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | | | පනත් කෙටුම්පත් | නියමයන් / නියෝග | යෝජනා/පරිපූරක ඇස්තමේන්තු | වාර්ෂික / කාර්ය සාධන වාර්තා | |
| 1 | ජාත්‍යන්තර සබඳතා පිළිබඳ | 10 | 1 | 4 | | 18 | 7 |
| 2 | ජාතික ආරක්ෂාව පිළිබඳ<br><br><u>අනු කමිටුව</u><br>• රථවාහන කළමණාකරණය පිළිබඳ | 3<br><br><br>9 | | 2 | | | 1 |
| 3 | කාන්තා සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ<br><br><u>වැඩමුළු</u><br>• ප්‍රජනන සෞඛ්‍යය අධ්‍යාපනය පිළිබඳ වැඩමුලුව<br><br>• පොදු රාජ්‍ය මණ්ඩලීය මහලේකම් කාර්යාලය විසින් පවත්වන ලද ක්‍රියාකාරී සැසිය | 13 | | | | 5 | 2 |
| 4 | අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය | 20 | | 5 | | 87 | 10 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | පිළිබඳ<br><br><u>අනු කමිටු</u><br>• උසස් අධ්‍යාපනය පිළිබඳ<br>• අධ්‍යාපනය පිළිබඳ | <br><br><br>30<br>2 | | | | | |
| 5 | ප්‍රවාහන හා සන්නිවේදන පිළිබඳ | 24 | 3 | 5 | 1 | 24 | 9 |
| 6 | කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ | 14 | | 1 | | 48 | 3 |
| 7 | නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ | 20 | 6 | 3 | | 1 | 9 |
| 8 | ව්‍යාපාර සහ වානිජ කටයුතු පිළිබඳ<br><br><u>අනු කමිටුව</u><br>• ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය සම්බන්ධයෙන් ගැටළු විසඳීම පිළිබඳ | 8<br><br><br><br><br>1 | 2 | 2 | | 20 | 4 |
| 9 | බලශක්ති පිළිබඳ<br><br><u>අනු කමිටුව</u><br>• විදුලිබල හා පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ | 10<br><br><br>10 | 1 | | | 5 | 3 |
| 10 | නිෂ්පාදන සහ සේවා පිළිබඳ<br><br><u>අනු කමිටුව</u><br>• සිමෙන්ති නිෂ්පාදනය සම්බන්ධ රාජ්‍ය ආයතන වැඩි දියුණු කිරීම | 06<br><br><br><br>2 | | | | 18 | 4 |

පහත දැක්වෙන ආංශික අධීක්ෂණ කාරක සභා 6 ට අදාල කටයුතු කාරක සභා II කාර්යාංශය මගින් ඉටු කරනු ලැබේ.

ඒ අනුව එක් එක් කාරක සභාව විසින් 2017 වර්ෂය තුල ඉටු කරන ලද කාර්යභාරය පහත දැක්වේ.

| | ආංශික අධීක්ෂණ කාරක සභාව | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | සලකා බැලීම් සංඛ්‍යාව | | | | පාර්ලිමේන්තුව වෙත පිළිගන්වන ලද වාර්තා සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | | | පනත් කෙටුම්පත් | නියමයන්/ නියෝග | යෝජනා/ පරිපූරක ඇස්තමේන්තු | වාර්ෂික/ කාර්ය සාධන වාර්තා | |
| 1 | ආර්ථික සංවර්ධන පිළිබඳ | 23 | 03 | 11 | -- | 62 | 16 |

| | ආංශික අධීක්ෂණ කාරක සභාව | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | සලකා බැලීම් සංඛ්‍යාව | | | | පාර්ලිමේන්තුව වෙත පිළිගන්වන ලද වාර්තා සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | | | පනත් කෙටුම්පත් | නියමයන්/ නියෝග | යෝජනා/ පරිපූරක ඇස්තමේන්තු | වාර්ෂික/ කාර්ය සාධන වාර්තා | |
| 2 | තිරසර සංවර්ධන සහ පරිසර හා ස්වාභාවික සම්පත් පිළිබඳ | 09 | 02 | 01 | -- | 26 | 05 |
| 3 | සෞඛ්‍යය හා මානව සුබසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ | 10 | 01 | 06 | -- | 40 | 09 |
| | <u>අනු කමිටු</u> | | | | | | |
| | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන පිළිබඳ | 05 | -- | -- | -- | -- | -- |
| 4 | තරුණ,ක්‍රීඩා,කලා සහ උරුමයන් පිළිබඳ | 10 | 01 | 02 | -- | 18 | 05 |
| 5 | අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ | 12 | 07 | 01 | -- | 23 | 07 |
| 6 | ප්‍රතිසන්ධාන හා උතුර හා නැගෙනහිර නැවත ගොඩනැඟීම පිළිබඳ | 05 | -- | -- | -- | 06 | 01 |
| | <u>වැඩමුළු</u> | | | | | | |
| | ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මංත්‍රීවරුන් සහ එක්සත් රාජධානියේ නියෝජිතයින් සමඟ පැවැත්වූ “අදහස් හුවමාරු කරගැනීමේ” වැඩමුළුව | | | | | | |

## 6.2 විශේෂ කාර්යයන් සඳහා වූ කාරක සභා

### (i) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව

ගරු. එම්.ඒ. සුමන්තිරන් මහතා සභාපතීත්වය දරන මෙම කාරක සභාවේ සාමාජිකත්වය 20 ක් වන අතර 2017 වර්ෂය තුල දී සභා වාර 30 ක් පවත්වා;

- පනත් කෙටුම්පත් 5 ක්
- නියෝග 5 ක්
- නියමයන් 40 ක්
- නිවේදන 9 ක්
- යෝජනා 9 ක්
- වාර්ෂික වාර්තා සහ කාර්ය සාධන වාර්තා 34 ක් සහ

අනෙකුත් සටහන් 13 ක් සලකා බලා ඇති අතර ඒවා සම්බන්ධයෙන් වාර්තා 16 ක් සභාගත කර ඇත.

තවද 2018 වර්ෂය සඳහා වූ අය වැය ඇස්තමේන්තු සැකසීමේදී පදනම් කරගත් රාජ්‍ය මුදල්, මූල්‍ය සහ ආර්ථික උපකල්පනයන් පිළිබඳව ඇගයීම් වාර්තාව ද සභාගත කරන ලදී.

### (ii) තේරීම් කාරක සභාව

ගරු කථානායක, කරු ජයසූරිය මහතා සභාපතීත්වය දරන මෙම කාරක සභාවේ සාමාජිකත්වය 20 ක් වන අතර 2017 වර්ෂය තුල දී සභා වාර 3 ක් පවත්වා ඇත.

### (iii) වරප්‍රසාද පිළිබඳ කාරක සභාව

ගරු තිලක් මාරපන මහතා සභාපතීත්වය දරන මෙම කාරක සභාවේ සාමාජිකත්වය 10 ක් වන අතර 2017 වර්ෂය තුල දී සභාවාර 4 ක් පවත්වා මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩවීම් 9 ක් සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී.

### (iv) උසස් නිලතල පිළිබඳ කාරක සභාව

ගරු කථානායක, කරු ජයසූරිය මහතා සභාපතීත්වය දරන මෙම කාරක සභාවේ සාමාජිකත්වය 15 ක් වන අතර 2017 වර්ෂය තුල දී සභාවාර 19 ක් පවත්වා;

- විදෙස් දූත මණ්ඩල ප්‍රධානී පත්වීම් 6 ක්
- අමාත්‍යාංශ ලේකම් පත්වීම් 33 ක්
- ආයතන සභාපති පත්වීම් 82 ක් කමිටුව හමුවට කැඳවා සුදුසුකම් පරීක්ෂා කර බලා

ඇත.

### (v) ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව

ගරු කථානායක, කරු ජයසූරිය මහතා සභාපතීත්වය දරන මෙම කාරක සභාවේ සාමාජිකත්වය 9ක් වන අතර 2017 වර්ෂය තුල සභාවාර 4 ක් පවත්වා කාරක සභාවෙන් නිර්දේශිත සංශෝධන ඇතුලත් කොට, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව සභාගත කරන ලදී.

## (vi) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව 2017 වර්ෂය තුල **ආයතන 50 ක්** කාරක සභාව හමුවට කැඳවා විමර්ශන 56 ක්ද අනු කමිටු රැස්වීම් 5ක්ද, විශේෂ සාකච්ඡා 2 ක්ද, විශේෂිත කරුණු පිළිබඳව විමර්ශන 03ක්ද පවත්වා රාජ්‍ය ආයතනයන්හි කාර්ය සාධනය මෙන්ම මුල්‍ය පාලනය ක්‍රමවත් කිරීම පිළිබඳ දැඩි අවධානයක් යොමු කර ඇත.

**2017 වර්ෂයේ ගිණුම් කාරක සභාව විසින් ආරම්භ කළ විශේෂිත /නව වැඩ සටහන් :-**

(අ) 2015 මුදල් වර්ෂය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණය යටතේ පැවති 831ක් වූ සියළුම රාජ්‍ය ආයතනයන්හි මූල්‍ය පාලනය හා හා කාර්යසාධනය ක්‍රමවත් කිරීමේ හා ඇගයීමේ අරමුණින් නව පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතියක් හරහා මාර්ගගත ආකාරයට තොරතුරු කැඳවා එම තොරතුරු පදනම් කර ගනිමින් සියළුම ආයතන ඇගයීමට ලක් කරන ලදී. එම ඇගයීම අනුව ඉහළම කාර්යසාධන මට්ටමක් පෙන්වා ඇති ආයතන ඇගයීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ, ගරු අග්‍රාමාත්‍යතුමාගේ හා ගරු කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් සම්මාන ප්‍රදානෝත්සවයක් පවත්වන ලදී.

(ආ) මෙම වැඩසටහනෙහි මීලඟ පියවර ලෙස 2016 මුදල් වර්ෂය සඳහා ද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණය යටතේ පැවති ආයතනයන්හි මූල්‍ය පාලනය හා කාර්යසාධනය පිළිබඳ ඇගයීම සඳහා එම පරිගණක තොරතුරු පද්ධතිය හරහා මාර්ගගත ආකාරයට තොරතුරු කැඳවීමේ ක්‍රියාවලියද අවසන් කරන ලදී.

**අනු කාරක සභා පත් කිරීම**

ශ්‍රී ලංකාවේ වෙරළ සංරක්ෂණය හා සංචාරක ප්‍රවර්ධනය සම්බන්ධයෙන් ගත යුතු පියවර සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ගරු සුජීව සේනසිංහ මහතාගේ සභාපතිත්වයෙන් යුතු අනු කාරක සභාවක් 2017 ජනවාරි මස 24 වන දින පත් කරන ලද අතර මේ වන විට එම කාරක සභාවේ රැස්වීම් වාර 4ක් පවත්වා ඇත.

**කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම**

2015 මුදල් වර්ෂය පදනම් කර ගනිමින් පරිගණක තොරතුරු පද්ධතිය හරහා මාර්ගගත ආකාරයට ලබා ගත් 831ක් වූ ආයතනවල මූල්‍ය පාලනය හා කාර්යසාධනය ඇගයීම පිළිබඳ තොරතුරු ඇතුලත් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ තුන්වන වාර්තාව 2017 නොවැම්බර් මස 13 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2017.01.24 දින සිට 2017.05.24 දින දක්වා විමර්ශනයට භාජනය කරන ලද විමර්ශන ඇතුලත් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිව්වන වාර්තාව 2017 දෙසැම්බර් මස 08 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

**<u>2017 වර්ෂය තුලදී, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනය කරන ලද ආයතන.</u>**

| අංක | ආයතනයේ නම | විමර්ශනය කල දිනයන් |
|---|---|---|
| 1. | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 2017.01.24 |
| 2. | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 2017.01.24 |
| 3. | ප්‍රවාහන අමාත්‍යාංශය | 2017.01.25 |

| | | |
|---|---|---|
| 4. | දකුණු පළාත් සභාව | 2017.01.25<br>2017.11.07 |
| 5. | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2017.01.26 |
| 6. | ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2017.01.26 |
| 7. | රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2017.02.21 |
| 8. | තැපැල් අමාත්‍යාංශය | 2017.02.22 |
| 9. | තැපැල් දෙපාර්තමේන්තුව | 2017.02.22 |
| 10. | නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය | 2017.02.23 |
| 11. | සමාජ සවිබලගැන්වීම් සහ සුභසාධන අමාත්‍යාංශය | 2017.03.07 |
| 12. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 2017.03.07<br>2017.04.04<br>2017.06.06<br>2017.07.25<br>2017.10.17 |
| 13. | විදේශ කටයුතු අමාත්‍යාංශය | 2017.03.09 |
| 14. | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 2017.03.09<br>2017.08.09 |
| 15. | කොළඹ මහ නගර සභාව | 2017.03.10 |
| 16. | මධ්‍යම පළාත් සභාව | 2017.03.10 |
| 17. | කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2017.03.21 |
| 18. | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 2017.03.22 |
| 19. | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | 2017.03.22 |
| 20. | ඌව පළාත් සභාව | 2017.03.23 |
| 21. | උතුරු මැද පළාත් සභාව | 2017.03.23 |
| 22. | බුද්ධ ශාසන අමාත්‍යාංශය සහ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 2017.03.24 |
| 23. | සේවක අර්ථසාධක අරමුදල | 2017.03.24 |
| 24. | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 2017.04.05 |
| 25. | නැගෙනහිර පළාත් සභාව | 2017.04.05 |
| 26. | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 2017.05.03 |
| 27. | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව | 2017.05.04 |

| | | |
|---|---|---|
| 28. | ක්‍රීඩා අමාත්‍යාංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 2017.05.05 |
| 29. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 2017.05.23 |
| 30. | උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය | 2017.05.24<br>2017.09.08 |
| 31. | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 2017.09.21 |
| 32. | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 2017.06.22 |
| 33. | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 2017.06.22 |
| 34. | පානදුර නගර සභාව | 2017.07.04 |
| 35. | කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2017.07.07 |
| 36. | ක්‍රීඩා අමාත්‍යාංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 2017.07.26 |
| 37. | කළුතර ප්‍රාදේශීය සභාව | 2017.07.27 |
| 38. | මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2017.07.17 |
| 39. | බුද්ධ ශාසන අමාත්‍යාංශය සහ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 2017.08.09 |
| 40. | උතුරු පළාත් සභාව | 2017.09.07 |
| 41. | කාත්තන්කුඩි නගර සභාව | 2017.09.19 |
| 42. | එරාවූර් නගර සභාව | 2017.09.19 |
| 43. | කොළඹ මහා නගර සභාව | 2017.10.20 |
| 44. | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 2017.11.16 |
| 45. | අධ්‍යාපන අමාත්‍යාංශය | 2017.11.17 |
| 46. | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 2017.12.08 |
| 47. | ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය | 2017.12.08 |
| 48. | වාරිමාර්ග හා ජල සම්පත් කළමානාකරණ අමාත්‍යාංශය | 2017.12.08 |
| 49. | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 2017.12.08 |
| 50. | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 2017.12.08 |

**<u>කාරක සභාව විසින් විශේෂිත වූ කාර්ය සාධන විගණනයන් පිළිබඳ විමර්ශනය කිරීම සඳහා පවත්වන ලද විශේෂ කාරක සභා රැස්වීම්</u>**

| අංක | විමර්ශනයට ලක් වූ කරුණු | විමර්ශනය කල දිනයන් |
|---|---|---|
| 01 | ඩෙංගු රෝගය තුරන් කිරීම පිළිබඳ කාර්යසාධන විගණනය | 2017.03.08 |
| 02 | පානීය ජල බෝතල් පිළිබඳ කාර්යසාධන විගණනය | 2017.03.08 |

| 03 | වී වගාව සඳහා සහනාධාර මත පොහොර සැපයීම පිළිබඳ කාර්යසාධන විගණනය | 2017.07. 06 |
|---|---|---|

| අංක | විමර්ශනයට ලක් වු කරුණු | විමර්ශනය කල දිනයන් |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකාවේ වෙරළ සංරක්ෂණය හා සංචාරක ප්‍රවර්ධනය සඳහා ගත යුතු පියවර නිර්දේශ කිරීම සඳහා පත් කළ අනු කාරක සභාවේ රැස්වීම් | 2017.02.22<br>2017.04.06<br>2017.08.10<br>2017.10.06<br>2017.10.25 |

**විශේෂ සාකච්ඡා**

| අංක | විමර්ශනයට ලක් වු කරුණු | විමර්ශනය කල දිනයන් |
|---|---|---|
| 01 | 2016 වර්ෂයේ මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික ගිණුම් වාර්තා සහ විගණකාධිපති වාර්තා පිළිබඳ විමර්ශනය | 2017.06.09<br>2017.08.22 |

## (vii) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව :

2017 වර්ෂය තුලදී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පහත සඳහන් ආයතනවල කාර්ය සාධනය සහ වර්තමාන කටයුතු පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා කාරක සභා රැස්වීම් පවත්වා වාර්තා සකස් කිරීමේ කටයුතුවල නිරත විය.

**කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම**

එයට අමතරව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් එයට පැවරුනු වැඩ කටයුතු සාර්ථක ලෙස නිම කර කාරක සභාව විමර්ශනය කරන ලද ආයතන සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳව වූ වාර්තා 03ක් 2017 පෙබරවාරි මස 08 දින, 2017 අප්‍රේල් මස 07 දින සහ 2017 ඔක්තෝබර් මස 19 යන දිනවලදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

**2017 වර්ෂය තුළදී කාරක සභාව විසින් විමර්ශනය කරන ලද ආයතන**

| අංක | ආයතනයේ නම | විමර්ශනය කල දිනය |
|---|---|---|
| 01 | ලංකා ඛනිජ තෙල් සංස්ථාව | 2017.01.25 |
| 02 | ලංකා ඛනිජ වැලි සමාගම | 2017.01.26 |
| 03 | ජාතික ලොතරැයි මණ්ඩලය | 2017.02.07 |
| 04 | ලංකා ඛනිජ වැලි සමාගම | 2017.02.07 |
| 05 | හිඟුරාන සීනි සමාගම | 2017.02.08 |
| 06 | ලංකා ධීවර සංස්ථාව | 2017.02.09 |
| 07 | ස්වාධීන රූපවාහිනී සේවය | 2017.02.21 |
| 08 | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 2017.02.22 |
| 09 | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 2017.03.07 |
| 10 | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය | 2017.03.08 |
| 11 | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 2017.03.09 |
| 12 | විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2017.03.10 |

| | | |
|---|---|---|
| 13 | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 2017.03.20 |
| 14 | කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 2017.03.21 |
| 15 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 2017.04.06 |
| 16 | ලංකා ගල් අඟුරු සමාගම | 2017.04.07 |
| 17 | ලංකා ලුණු සමාගම | 2017.05.03 |
| 18 | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 2017.05.05 |
| 19 | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 2017.05.23 |
| 20 | ජාතික අධ්‍යාපන ආයතනය | 2017.05.25 |
| 21 | විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2017.06.06 |
| 22 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 2017.06.09 |
| 23 | ලංකා හොස්පිටල් | 2017.06.20 |
| 24 | ගල් ඔය වතු සමාගම | 2017.06.21 |
| 25 | කොළඹ විශ්වවිද්‍යාලය | 2017.07.04 |
| 26 | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 2017.07.05 |
| 27 | වී අලෙවි මණ්ඩලය | 2017.07.06 |
| 28 | රාජ්‍ය ඖෂධ සංස්ථාව | 2017.07.07 |
| 29 | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ සහ පුහුණු කිරීමේ ආයතනය | 2017.07.25 |
| 30 | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය | 2017.07.26 |
| 31 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 2017.08.08 |
| 32 | සබරගමුව විශ්වවිද්‍යාලය | 2017.08.09 |
| 33 | ශ්‍රී ලංකා ගුවන් සේවය | 2017.08.10 |
| 34 | මිල්කෝ පුද්ගලික සමාගම | 2017.08.11 |
| 35 | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 2017.08.22 |
| 36 | මිල්කෝ පුද්ගලික සමාගම | 2017.08.22 |
| 37 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 2017.08.23 |
| 38 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 2017.08.09 |
| 39 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 2017.08.25 |
| 40 | මිල්කෝ පුද්ගලික සමාගම | 2017.09.06 |
| 41 | ශ්‍රී ලංකා ගුවන් සේවය | 2017.09.06 |
| 42 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 2017.09.08 |
| 43 | මාර්ග සංවර්ධන අධිකාරිය | 2017.09.19 |
| 44 | ශ්‍රී ලංකා ගුවන් සේවය | 2017.09.20 |
| 45 | රුහුණු විශ්වවිද්‍යාලය | 2017.09.21 |
| 46 | කැළණිය විශ්වවිද්‍යාලය | 2017.09.22 |
| 47 | අග්නිදිග විශ්වවිද්‍යාලය | 2017.11.17 |
| 48 | නැගෙනහිර විශ්වවිද්‍යාලය | 2017.11.22 |
| 49 | යාපනය විශ්වවිද්‍යාලය | 2017.11.23 |
| 50 | වයඹ විශ්වවිද්‍යාලය | 2017.11.28 |
| 51 | ඌව විශ්වවිද්‍යාලය | 2017.11.29 |

**(viii) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව :**

2017 වසර සඳහා කාරක සභාවේ පළමු රැස්වීම 2017.02.08 දින පවත්වා ඇති අතර එම වර්ෂය තුළ රැස්වීම් වාර 37 ක් පවත්වා පෙත්සම් 348 ක් සලකා පෙත්සම් ගොනු 105 ක් අවසන් කර ඇත. මෙම පෙත්සම් ගොනු 105 තුළ සහන ලබා ගත් පෙත්සම්කරුවන් 27 දෙනෙක් සිටින අතර ඉතිරි පෙත්සම්කරුවන් සඳහා සහන ලබා දීමට කාරක සභාවට ප්‍රතිපාදන නොමැති බැවින් එම ගොනු අවසන් කර ඇත.

පෙත්සම් කාරක සභාවේ කාර්යයන් පිළිබඳව දළ අසංශෝධිත සංඛ්‍යාත්මක දත්ත පහත පරිදි වේ.

| | |
|---|---|
| 2017 වර්ෂය තුළ කාරක සභා කාර්යාංශයට ලැබී ඇති මුළු පෙත්සම් ගණන | 1062 |
| ස්ථාවර නියෝග වලට අනුකූල නොවීම මත කාරක සභා කාර්යාංශය විසින් භාර නොගත් පෙත්සම් ගණන | 413 |
| ඉදිරි කටයුතු සඳහා කාරක සභා කාර්යාංශය විසින් භාර ගත් පෙත්සම් ගණන | 649 |
| 2017 වර්ෂයේදී කථානායකතුමාගේ අනුමැතියට යොමු කර ඇති පෙත්සම් ගණන ( මෙම පෙත්සම් 649 න් 39 ක් 2016 වසරේ ලැබුනු පෙත්සම් වන අතර ඉතිරි 610, 2017 වසරේදී ලැබුනු පෙත්සම් වේ) | 649 |
| 2017 වර්ෂය තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති පෙත්සම් ගණන (2015, 2016 වර්ෂවලදී ලැබී එම වර්ෂ තුළ ඉදිරිපත්ව නොවී ඉතිරිව තිබූ පෙත්සම්ද 2017 වසරේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි) | 658 |
| විමර්ශන කටයුතු සඳහා ඔම්බුඩ්ස්මන්තුමා වෙත යොමු කර ඇති පෙත්සම් ගණන | 66 |
| කාරක සභාව රැස්වූ වාර ගණන | 37 |
| කාරක සභාව විසින් සලකා බලා ඇති පෙත්සම් ගණන | 348 |
| සහන ලබා දි ඇති පෙත්සම්කරුවන් ගණන | 27 |
| අවසන් කර ඇති පෙත්සම් ගොනු ගණන (සහන ලබා දී/ නොදී) | 105 |

## 6.3 විශේෂ කාරක සභා

**(i) තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව:**

ගරු නියෝජ්‍ය කථානායක, තිලංග සුමතිපාල මහතා සභාපතිත්වය දරන මෙම කාරක සභාවේ සමාජිකත්වය 15 ක් වන අතර 2017 වර්ෂය තුල දී සභාවාර 5 ක් පවත්වා ඇත. කාරක සභාවේ කටයුතු වඩාත් පුළුල් කිරීමේ අරමුණින්;

- ගරු. නිරෝෂන් පෙරේරා
- ගරු. බුද්ධික පතිරණ
- ගරු බිමල් රත්නායක සහ
- ගරු අනුරාධ ජයරත්න

යන මහත්වරුන්ගේ සභාපතීත්‍වයෙන් සාමාජික සංඛ්‍යාව 3 ක් වන අනුකමිටු 4 ක් පත්කරන ලද අතර එකී සාකච්ඡා පදනම් කරගනිමින් එක් අතුරු වාර්තාවක් සභාගත කර ඇත.

තවද තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත් කරනු වස් එක් වැඩමුළුවක් ද සංවිධානය කරන ලදී.

**(ii) බ්‍රසීලයෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ ඇමරිකා එක්සත් ජනපදයෙහි, නිව්යෝක් නුවර, එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් ස්ථානය වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් දරන ලද වියදම පිළිබඳ සොයා බලා වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව**

ගරු ආනන්ද කුමාරසිරි මහතා සභාපතීත්වය දරන මෙම කාරක සභාවේ සාමාජිකත්වය 21 ක් වන අතර 2017 වර්ෂය තුල දී සභාවාර 7 ක් පවත්වා ඇත.

**(iii) 2018 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවලින් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂයන් පිළිබඳ සාකච්ඡා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව**

ගරු මහින්ද සමරසිංහ මහතා සභාපතිත්වය දැරූ මෙම කාරක සභාවේ සාමාජිකත්වය 21 ක් වූ අතර 2017 වර්ෂය තුල දී සභාවාර 12 ක් පවත්වා අමාත්‍යාංශ වැය ශීර්ෂ 10 ක් සළකා බලා අවසන් වාර්තාව සභාගත කරන ලදී.

**(iv) විදේශගත ශ්‍රී ලාංකිකයන් හට ඉදිරි මැතිවරණවල දී ඡන්දය පාවිච්චි කිරීමට ඇති ඉඩකඩ සලසා දීමේ සහ ඊට අනුෂාංගික කරුණු විමර්ශනය කර පියවර නිර්දේශ කොට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව**

ගරු. තලතා අතුකෝරල මහත්මිය සභාපතිත්වය දරන මෙම කාරක සභාවේ සාමාජිකත්වය 21 ක් වන අතර 2017 වර්ෂය තුළ සභාවාර 4 ක් පවත්වා විදේශගත ශ්‍රී ලාංකිකයන් හට ඡන්දය පාවිච්චි කිරීමේ ඉඩකඩ සලසාදීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් වැඩමුළුවක් ද පවත්වා ඇත. තවද සාකච්ඡාවට බඳුන් වූ කරුණු අනුසාරයෙන් සැකසූ අතුරු වාර්තාව සඳහා කාරක සභාවේ අනුමැතිය ලැබී ඇත.

**තත්කාර්ය කාරක සභා**

**පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය**

ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය සභාපතිත්වය දරන මෙම කාරක සභාවේ සාමාජිකත්වය 12ක් වන අතර 2017 වර්ෂය තුල සභාවාර 3 ක් පවත්වා ඇත.

2017 තුල වඩාත් ක්‍රියාකාරී වූ මෙම කමිටුව විසින්;

- කිලිනොච්චියේ දී ජාත්‍යන්තර කාන්තා දිනය සැමරුම් වැඩසටහන ක් ද
- පොදු ප්‍රවාහන සේවා භාවිතයේදී සිදුවන කාන්තා හිංසනය පිටු දැකීමේ ස්ටිකර් ව්‍යාපාරයක් ද
- දේශපාලනයේ කාන්තා නියෝජනය පිළිබඳව සමාජය දැනුවත් කිරීමේ වැඩමුළු දෙකක් ද සංවිධානය කර පවත්වන ලදී.

**ළමුන් සඳහා වන පාර්ලිමේන්තු සංසදය**

ගරු (වෛද්‍ය) සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය සභාපතිත්වය දරන මෙම කාරක සභාවේ සාමාජිකත්වය 14 ක් වන අතර UNICEF සංවිධානයේ අනුග්‍රහයෙන් පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳ පාර්ලිමේන්තු සමුලුව සංවිධානය කර පවත්වන ලදී.

## 6.4 පනත් කෙටුම්පත් කාර්යාංශය :

පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති ප්‍රමුඛතම ව්‍යවස්ථාදායක කාර්යභාරය වන නීති සම්පාදනයට අදාළ ක්‍රියාපටිපාටිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල විධිවිධානවලට අනුව ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම පනත් කෙටුම්පත් කාර්යංශයේ මෙහෙවරයි.

ඒ යටතේ පනත් කෙටුම්පත් කාර්යංශය විසින් රජයේ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ සිට සම්මත කිරීමෙන් පසුව එම පනත් සඳහා කථානායකවරයාගේ සහතිකය සටහන් කිරීමෙන් අනතුරුව මුද්‍රණය කිරීම දක්වා සපුරාලිය යුතු වන සියලුම ව්‍යවස්ථාදායකමය පියවරයන්ට අදාළ කටයුතු භාෂාත්‍රයෙන්ම ඉටු කරනු ලබන්නේය.

එසේම, පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ගැසට් මුද්‍රණයේ සිට එම පනත් පාර්ලිමේන්තුවේ දී සම්මත කර මුද්‍රණ කරන තෙක් කටයුතු ද ඒ අයුරින්ම භෂාත්‍රයෙන්ම ඉටු කරනු ලබයි.

**2017 වර්ෂය තුළ දී,**

| | |
|---|---|
| පනත් කෙටුම්පත් කාර්යංශය වෙත ලැබුණු රජයේ පනත් කෙටුම්පත් ගැසට් සංඛ්‍යාව | 43 |
| පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද රජයේ පනත් කෙටුම්පත් ගැසට් සංඛ්‍යාව | 39 |
| පනත් කෙටුම්පත් කාර්යංශය විසින් මුද්‍රණය කිරීමට කටයුතු කරන ලද පනත් කෙටුම්පත් සංඛ්‍යාව | 39 |
| ඉල්ලා අස්කර ගනු ලැබූ රජයේ පනත් කෙටුම්පත් සංඛ්‍යාව | 02 |
| පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ පනත් කෙටුම්පත් සංඛ්‍යාව | 32 |
| ගරු කථානායකතුමා විසින් සහතිකය සටහන් කළ රජයේ පනත් සංඛ්‍යාව | 32 |
| පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරිමට අදාළව පනත් කෙටුම්පත් කාර්යංශයවෙත ලැබුනු ඉල්ලීම් අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පෞද්ගලික මන්ත්‍රි පනත් ගැසට් සංඛ්‍යාව | 32 |
| අමාත්‍ය වාර්තා ලබා ගැනීමට පිණිස යොමුකරන ලද පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් සංඛ්‍යාව | 32 |
| පළාත් සභා වෙතින් කළ විමසීම් අනුව පාර්ලිමේන්තුවේ නිරීක්ෂණ යවන ලද ප්‍රඥප්ති කෙටුම්පත් සංඛ්‍යාව | 01 |

2017 වර්ෂය තුළ රජයේ පනත් කෙටුම්පත් හා සම්බන්ධව පවත්වන ලද ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වීම් සඳහා පනත් කෙටුම්පත් කාර්යංශයේ නිලධාරීන් සහභාගී වී අවශ්‍ය දායකත්වය ලබා දී ඇත.

**2017 වර්ෂයේදී සම්මත වූ පනත් කෙටුම්පත්**

| අංකය | පනත් අංකය | පනත් නාමය | සහතිකය සටහන් කල දිනය |
|---|---|---|---|
| 1 | 1/2017 | වෛද්‍ය (සංශෝධන)<br>மருத்துவம் (திருத்தம்)<br>Medical (Amendment) | 2017-02-21 |
| 2 | 2/2017 | දිවි නැගුම (සංශෝධන)<br>வாழ்வின் எழுச்சி (திருத்தம்)<br>Divineguma (Amendment) | 2017-02-21 |
| 3 | 3/2017 | ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන)<br>காணி (பராதீனப்படுத்தல் மீதான மட்டுப்பாடுகள்) (திருத்தம்)<br>Land (Restriction on Alienation) (Amendment) | 2017-02-22 |
| 4 | 4/2017 | ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව<br>இலங்கைப் பொறியியற் பேரவை<br>Engineering Council, Sri Lanka | 2017-03-09 |

| | | | |
|---|---|---|---|
| 5 | 5/2017 | අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ<br>கைமீட்கப்பட முடியாத நன்கொடை உறுதிகளை முழுமையான நன்றியீனம் என்னும் ஏதுவின்மீது கைமீட்டல்<br>Revocation of Irrevocable Deeds of Gift on the Ground of Gross Ingratitude | 2017-04-04 |
| 6 | 6/2017 | ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන)<br>தேசிய போக்குவரத்து ஆணைக்குழு (திருத்தம்)<br>National Transport Commission (Amendment) | 2017-04-07 |
| 7 | 7/2017 | ආර්ථික සේවා ගාස්තු (සංශෝධන)<br>பொருளாதாரச் சேவை விதிப்பனவு (திருத்தம்)<br>Economic Services Charge (Amendment) | 2017-05-17 |
| 8 | 8/2017 | සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)<br>குடியியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்)<br>Civil Procedure Code (Amendment) | 2017-06-07 |
| 9 | 9/2017 | අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) (සංශෝධන)<br>காணாமற்போன ஆட்கள் பற்றிய அலுவலகம் (தாபித்தலும் நிருவகித்தலும் பணிளை நிறைவேற்றுதலும் (திருத்தம்)<br>Office on Missing Persons (Establishment, Administration and Discharge of Functions) (Amendment) | 2017-07-03 |
| 10 | 10/2017 | ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන)<br>தேருநர்களைப் பதிவு செய்தல் (விசேட ஏற்பாடுகள்)<br>Registration of Electors (Special Provisions) | 2017-07-21 |
| 11 | 11/2017 | ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන)<br>கடற்றொழில் நீர்வாழ் உயிரின வளங்கள் (திருத்தம்)<br>Fisheries and Aquatic Resources (Amendment) | 2017-07-25 |
| 12 | 12/2017 | විදේශ විනිමය<br>வெளிநாட்டுச் செலாவணி<br>Foreign Exchange | 2017-07-28 |
| 13 | 13/2017 | ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන)<br>நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்)<br>Nation Building Tax (Amendment) | 2017-08-09 |
| 14 | 14/2017 | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය (සංශෝධන)<br>சுகததாச தேசிய விளையாட்டுகள் கட்டிடத்தொகுதி அதிகாரசபை (திருத்தம்)<br>Sugathadasa National Sports Complex Authority (Amendment) | 2017-08-17 |
| 15 | 15/2017 | ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය<br>இலங்கை ஜேர்மன் தொழில்நுட்ப்ப பயிற்சி நிறுவகம்<br>Ceylon German Technical Training Institute | 2017-08-24 |
| 16 | 16/2017 | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)<br>உள்ளூர் அதிகாரசபைகள் தேர்தல்கள் (திருத்தம்)<br>Local Authorities Elections (Amendment) | 2017-08-31 |
| 17 | 17/2017 | පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන)<br>மாகாண சபைத் தேர்தல்கள் (திருத்தம்)<br>Provincial Councils Elections (Amendment) | 2017-09-22 |

| | | | |
|---|---|---|---|
| 18 | 18/2017 | මෝටර් වාහන (සංශෝධන)<br>மோட்டார் வாகனம் (திருத்தம்)<br>Motor Traffic (Amendment) | 2017-10-03 |
| 19 | 19/2017 | ශ්‍රී ලංකා තිරසර සංවර්ධන<br>இலங்கை நிலைபேறுதகு அபிவிருத்தி<br>Sri Lanka Sustainable Development | 2017-10-03 |
| 20 | 20/2017 | මහ නගර සභා (සංශෝධන)<br>மாநகர சபைகள் (திருத்தம்)<br>Municipal Councils (Amendment) | 2017-10-12 |
| 21 | 21/2017 | නගර සභා (සංශෝධන)<br>நகர சபைகள் (திருத்தம்)<br>Urban Councils (Amendment) | 2017-10-12 |
| 22 | 22/2017 | ප්‍රාදේශීය සභා (සංශෝධන)<br>பிரதேச சபைகள் (திருத்தம்)<br>Pradeshiya Sabha (Amendment) | 2017-10-12 |
| 23 | 23/2017 | රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන)<br>காப்புறுதித் தொழிலை ஒழுங்குபடுத்தல் (திருத்தம்)<br>Regulation of Insurance Industry (Amendment) | 2017-10-19 |
| 24 | 24/2017 | දේශීය ආදායම්<br>உண்ணாட்டரசிறை<br>Inland Revenue | 2017-10-24 |
| 25 | 25/2017 | ඉලෙක්ට්‍රොනික ගනුදෙනු (සංශෝධන)<br>இலத்திரனியல் கொடுக்கல் வாங்கல்கள் (திருத்தம்)<br>Electronic Transactions (Amendment) | 2017-11-02 |
| 26 | 26/2017 | අධිකරණ සංවිධාන (සංශෝධන)<br>நீதித்துறை (திருத்தம்)<br>Judicature (Amendment) | 2017-11-17 |
| 27 | 27/2017 | අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන)<br>குற்றச்செயல்களுக்கு பலியாக்கப்பட்டோருக்கும் சாட்சிகளுக்குமான உதவி மற்றும் பாதுகாப்பு (திருத்தம்)<br>Assistance to and Protection of Victims of Crime and Witnesses (Amendment) | 2017-11-17 |
| 28 | 28/2017 | පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන)<br>உள்ளூர் அதிகாரசபைகள் (விசேட ஏற்பாடுகள்)<br>Local Authorities (Special Provisions) | 2017-11-17 |
| 29 | 29/2017 | අපරාධ වැළැක්වීමේ (සංශෝධන)<br>குற்றச்செயல்களைத் தடுத்தல் (திருத்தம்)<br>Prevention of Crimes (Amendment) | 2017-11-18 |
| 30 | 30/2017 | විසර්ජන<br>ஒதுக்கீடு<br>Appropriation | 2017-12-09 |
| 31 | 31/2017 | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)<br>உள்ளூர் அதிகாரசபைகள் தேர்தல்கள் (திருத்தம்)<br>Local Authorities Elections (Amendment) | 2017-12-14 |
| 32 | 32/2017 | විසර්ජන (සංශෝධන)<br>ஒதுக்கீடு (திருத்தம்)<br>Appropriation (Amendment) | 2017-12-14 |

## 6.5 සභාලේඛන කාර්යාංශය :

(i) පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට අදාළ ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත යෝජනා සහ ප්‍රශ්න ඇතුළත් න්‍යාය පුස්තක 03 ක් හා ඒ හා සම්බන්ධ පරිපූරක 24 ක් ද, පාර්ලිමේන්තුවේ රැස්වීම් 95 ක් වෙනුවෙන් න්‍යාය පත්‍ර සහ කාර්ය සටහන්ද, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සකස් කර මුද්‍රණය කිරීම.

(ii) අමාත්‍යාංශ, ඒවා යටතට ගැනෙන දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාළව ඒ ඒ අමාත්‍යාංශවලින් යොමු කරනු ලබන කාර්ය සාධන සහ වාර්ෂික වාර්තා 437 ක් ද, විවිධ පනත් යටතේ සකස් කර ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග, රෙගුලාසි සහ නියමයන් අඩංගු යෝජනා ද, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

(iii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් භාර දෙන ලද වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 1074 ක් ලියාපදිංචි කරන ලදුව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව සංස්කරණය කර, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලට පරිවර්තනය කර න්‍යාය පුස්තකවලට හෝ අදාළ පරිදි න්‍යාය පුස්තක පරිපූරකවලට ඇතුළත් කිරීමට කටයුතු කිරීම.

(iv) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනා 18 ක් සහ දින නියමයක් නොමැති යෝජනා 03 ක් භාරගෙන සංස්කරණය කර, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලට පරිවර්තනය කරන ලදුව න්‍යාය පුස්තකවලට හෝ අදාළ පරිදි න්‍යාය පුස්තක පරිපූරකවලට ඇතුළත් කිරීමට කටයුතු කිරීම.

(v) පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම් 43 ක් කැඳවා, ඒ පිළිබඳ කාර්ය සටහන් භාෂාත්‍රයෙන්ම නිකුත් කිරීමට කටයුතු කිරීම සහ එකී තීරණවලට අදාළ පසුවිපරම් කටයුතු කිරීම.

(vi) ජනාධිපතිවරයාගෙන් ලැබුණු සංදේශ 01 ක් ද, කථානායකවරයාගේ නිවේදන 86 ක් ද, රජයේ පනත් කෙටුම්පත් 39 ක් ඇතුළුව පනත් කෙටුම්පත් 51 ක් ද, පනත් කෙටුම්පත් පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණ සහ අමාත්‍යවරයන්ගේ ලිපිලේඛන පිළිගැන්වීම යනාදිය ඇතුළත් පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට අදාළ දවසේ වැඩපිළිවෙළ සකස් කිරීමේ කටයුතු සම්පාදනය කිරීම.

(vii) 2017 වර්ෂයට අදාළව ශෝක ප්‍රකාශ යෝජනා 06 ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඊට අදාළ හැන්සාඩ් වාර්තාව, උද්ධෘත, කැඳවීම් ලිපි, පාර්ලිමේන්තු රැස්වීම් න්‍යාය පත්‍ර අභාවප්‍රාප්ත මන්ත්‍රීවරයාගේ කලත්‍රයාට හෝ සමීප ඥාතීන්ට යැවීමට කටයුතු කිරීම.

## 6.6 පාර්ලිමේන්තු කථා පරිවර්තක කාර්යාලය :

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පාර්ලිමේන්තු කථා පරිවර්තක කාර්යාලයෙන් සපයන ලද සේවාවන් පහත පරිදි වේ.

(i) පාර්ලිමේන්තු රැස්වීම් දිනවලදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සභා ගර්භය තුළ සිංහල/ඉංග්‍රීසි, සිංහල/දෙමළ, දෙමළ/ඉංග්‍රීසි භාෂාවෙන් සමගාමී කථා පරිවර්තන සේවාවන් සැපයීම.

(ii) ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වීම්වලදී සහ කාරක සභා කාමරවල පවත්වන ලද වෙනත් රැස්වීම්වලදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, රජයේ නිලධාරීන් සහ කාරක සභාවලට සහභාගීවන විවිධ නිලධාරීන් සඳහා සිංහල/ඉංග්‍රීසි, සිංහල/දෙමළ, දෙමළ/ඉංග්‍රීසි භාෂාවෙන් සමගාමී කථා පරිවර්තන සේවාවන් සැපයීම.

(iii) පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම්, පෙත්සම් පිළිබඳ කාරක සභා රැස්වීම් සහ සමගාමී කථා පරිවර්තන පහසුකම් නොමැති කාරක සභා කාමරවල පවත්වන ලද රැස්වීම්වලදී දෙමළ භාෂාව කථාකරන මන්ත්‍රීවරුන්ට සමීපස්ථ කථා පරිවර්තන සේවාවන් සැපයීම.

(iv) පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයේ පළකරනු ලබන වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සහ වාචික නොවන පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සිංහල/ඉංග්‍රීසි, සිංහල/දෙමළ, දෙමළ/ඉංග්‍රීසි භාෂාවන්ට පරිවර්තනය කිරීම. 2017 වර්ෂය තුළදී එක් එක් අංශය විසින් පරිවර්තනය කරන ලද ප්‍රශ්න සංඛ්‍යාව පහත පරිදි වේ.

| අංශය | ප්‍රශ්න සංඛ්‍යාව |
|---|---|
| සිංහල/ඉංග්‍රීසි | 1019 |
| සිංහල/දෙමළ | 1049 |
| දෙමළ/ඉංග්‍රීසි | 11 |

2017 වසර තුළදී රාජකාරී ලිපි ලේඛන රාශියක් සිංහල/ඉංග්‍රීසි, සිංහල/දෙමළ, දෙමළ/ඉංග්‍රීසි භාෂාවන්ට පරිවර්තනය කරන ලද අතර එක් එක් අංශය විසින් පරිවර්තනය කරන ලද පිටු සංඛ්‍යාව පහත පරිදි වේ.

| අංශය | පරිවර්තන පිටු සංඛ්‍යාව |
|---|---|
| සිංහල/ඉංග්‍රීසි | 1652 |
| සිංහල/දෙමළ | 914 |
| දෙමළ/ඉංග්‍රීසි | 858 |

## 6.7 පාර්ලිමේන්තු පුස්තකාලය :

2017 වසරේ දී පුස්තකාලයේ ප්‍රධාන එකතුවට සිංහල හා ඉංග්‍රීසි යන භාෂාවලට අදාළ ප්‍රකාශන අත්පත් කරගන්නා ලදී. ඒ පහත දැක්වෙන පරිදිය.

පොත් - 750

පුවත්පත් - 34

වාර සඟරා - 14

පුස්තකාලය මගින් සංඛ්‍යාංකනය (Digitize) කරන ලද විවිධ විෂයයන්ට අයත් කාලීන වැදගත්කමකින් යුත් දුර්ලභ සහ වැදගත් ප්‍රලේඛන වල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ අවශ්‍යතා සඳහා ලබා දෙන ලදී.

2017 වසරේදී ද පාර්ලිමේන්තු පුස්තකාලය විසින් ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු කථානායකතුමා, ගරු ආණ්ඩුපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, ගරු සභානායකතුමා, ගරු විපක්ෂනායකතුමා ඇතුළු ගරු මැති ඇමතිතුමන්ලාට අවශ්‍ය වූ විවිධ තොරතුරු අවශ්‍යතා සාර්ථක ලෙස සපුරන ලදී.

පාර්ලිමේන්තු මහ ලේකම්තුමා ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයේ රාජකාරී කටයුතු වලදී අවශ්‍ය වන නොයෙක් තොරතුරු සපයා දීම ද පුස්තකාලය විසින් ඉටු කරන ලද තවත් වැදගත් කාර්යයකි.

එසේම ජනාධිපති කාර්යාලය, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු විවිධ රජයේ හා පුද්ගලික ආයතන විසින් වරින් වර ඉදිරිපත් කරන ලද තොරතුරු ඉල්ලීම් ඉටු කර දෙන ලදී. මීට අමතරව පුස්තකාලයේ නීති රීති, රෙගුලාසි හා ප්‍රතිපත්ති වලට යටත්ව රාජ්‍ය නොවන සංවිධාන වලට අවශ්‍ය වූ තොරතුරු සපයා දීම තුලින් පුස්තකාල සහයෝගීතාවය තව තවත් වර්ධනය කර ගැනීමට කටයුතු කර ඇත.

පුස්තකාලය විසින් පොත් සහ අනෙකුත් ප්‍රලේඛන 1211 ක් නිකුත් කර ඇත.

2017 වසරේදී ජාතික වැදගත්කමකින් යුත් විවිධ විෂයයන්ට අදාළ හදිසි තොරතුරු අවශ්‍යතා මතුවූ අවස්ථාවල විවිධ විමර්ශන ග්‍රන්ථ, පුවත්පත්, සඟරා හා අන්තර්ජාලය ආදී විවිධ තොරතුරු මූලාශ්‍ර භාවිතා කරමින් ඉතාමත් කෙටි කාලයක් තුළ තොරතුරු ගොණු 510 ක් පමණ සපයා ඇත.

පසුගිය වසර තුළදී මන්ත්‍රීවරුන්ගේ ක්ෂණික විමර්ශන සඳහා දිනපතා පළවන ජාතික පුවත්පත් හා වාරසඟරා වලින් කාලීන වැදගත්කමකින් යුත් විවිධ ප්‍රවෘත්ති සහ ලිපි 3000 කට අධික සංඛ්‍යාවක් ඡායා පිටපත්කරණය හා පරිලෝකණය (Scan) මගින් සපයා ඇත.

එසේම හැන්සාර්ඩ් වාර්තා, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා, පනත් කෙටුම්පත්, පනත් ආදී පාර්ලිමේන්තු ප්‍රකාශන වලින් ද ගැසට් පත්‍ර, අමාත්‍යාංශ ප්‍රගති වාර්තා, සංස්ථා, මණ්ඩල හා විවිධ ආයතන මගින් නිකුත් කරන ලද ප්‍රගති වාර්තා සහ වාර්ෂික වාර්තා ආදියේ මුද්‍රිත පිටපත් වලින් මෙන්ම ඉලෙක්ට්‍රොනික පිටපත් වලින්ද අවශ්‍ය තොරතුරු ලබා ගෙන සකස් කරන ලද ප්‍රලේඛණ සහ වාර්තා 100 ක් පමණ සපයා ඇත.

මෙවර ද 2018 වසර සඳහා පාර්ලිමේන්තු දිනපොත සැලසුම් කර සම්පාදනය කරන ලද අතර, එහි පිටපත් 4200 ක් (විශාල- 1200, මධ්‍යම - 3000) රජයේ මුද්‍රණාලය මගින් මුද්‍රණය කරවා ගරු කථානායකතුමා, ගරු නියෝජ්‍ය කථානායකතුමා, ගරු කාරක සභා සභාපතිතුමා, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, සමස්ත පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සහ පාර්ලිමේන්තුවට අනුබද්ධ අනෙකුත් කාර්ය මණ්ඩල අතර බෙදා හරින ලදී.

පුස්තකාලයේ පර්යේෂණ අංශය විසින් පසුගිය වසර තුළ පහත දැක්වෙන කාර්යයන් සපුරා ඇත.

| | |
|---|---|
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම් | - 242 |
| කථානායක තුමා / මහ ලේකම් කාර්යාලයේ කටයුතු සහ පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායම් විදේශ සමුළු වලට සහභාගිවීමේදී අවශ්‍ය වන කථා සකස් කිරීම් | - 72 |
| පනත් කෙටුම්පත් සඳහා පසුබිම් වාර්තා | - 31 |
| තාක්ෂණික වාර්තා | - 08 |
| පර්යේෂණ පත්‍රිකා | - 06 |
| පාර්ලිමේන්තු පර්යේෂණ සඟරාව | - වෙ. 1 කා. 6 - 1 |

## 7 වේත්‍රධාරී දෙපාර්තමේන්තුව :

පාර්ලිමේන්තු ක්‍රියාදාමය සපුරාලීමට අවශ්‍ය පහසුකම් සළසනු පිණිස ගරු කථානායකතුමා, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ඔවුනගේ කාර්ය මණ්ඩල, පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සහ අනුබද්ධිත කාර්ය මණ්ඩල යන අංශවලට වෘත්තීමය වශයෙන් කාලෝචිත සේවා සැපයීම මෙම දෙපාර්තමේන්තුවේ අරමුණ වේ.

2017 වර්ෂය තුල දී ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන්:-

1. ආරක්ෂක කටයුතු

   පාර්ලිමේන්තුවේ ආරක්ෂක තත්ත්වය ප්‍රශස්ත මට්ටමක පවත්වාගන්නා අතරතුර පූර්ව ආරක්ෂක කමිටු රැස්වීම්වලදී ගන්නා ලද දැඩි ආරක්ෂක විධිවිධාන තරමක් දුරට ලිහිල් කිරීමේ ක්‍රියාදාමයකට 2010 වසරේ සිට අවතීර්ණ විය. ගරු කථානායකතුමාගේ උපදෙස් ප්‍රකාර එම වැඩ පිළිවෙල 2017 වසරේ දී ද, ක්‍රියාත්මක විය.

ආරක්ෂක තත්ත්වය උපරිම තලයක පවත්වා ගනිමින් යම් යම් ආරක්ෂක විධිවිධාන ලිහිල් කිරීමට 2017 වසරේ දී ද, හැකි වූ අතර ඒ සම්බන්ධිත තීරණ පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් සහ කාර්ය මණ්ඩලය ද, රාජ්‍ය නිලධාරීන් ද, දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

ඒ අනුව, ගරු මන්ත්‍රීවරුන් සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය ද, රාජකාරි කටයුතු සඳහා පැමිණෙන රාජ්‍ය නිලධාරීන් ද, පමණක් නොව පාර්ලිමේන්තු නැරඹීම පිණිස පැමිණෙන මහජනතාවට ද, පහසුව සැලසුනි.

ආරක්ෂාව හා ඊට සම්බන්ධිත වෙනත් විෂයයන් යටතේ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය හා අනුබද්ධිත කාර්ය මණ්ඩල සඳහා වැඩ මුළු, සම්මන්ත්‍රණ ආදිය සංවිධානය කිරීම සහ වේත්‍රධාරී දෙපාර්තමේන්තු සේවකයින් සඳහා පුහුණු අවස්ථා ලබාදීමද සිදු කරන ලදී.

2 විශේෂ අමුත්තන්ගේ පැමිණීම (VIP Visits)

2017 වර්ෂය තුලදී විශේෂ අමුත්තන්ගේ පැමිණීම දළ වශයෙන් 560 ක් පමණ විය.

3 විවිධ කාණ්ඩයන්ට අයත් ප්‍රවේශ අවසරපත් නිකුත් කිරීම.

(අ) වාර්ෂික අවසරපත් නිකුත් කිරීම.(දළ වශයෙන්)

| රජයේ නිලධාරීන්ගේ අවසරපත් | රජයේ නිලධාරීන්ගේ මැදිරි අවසරපත් | භෝජනාගාර අවසරපත් | පෞද්ගලික ලේකම් අවසරපත් | ලේකම්වරුන් ගේ වාහන අවසරපත් | මන්ත්‍රීවරුන් ගේ වාහන අවසරපත් |
|---|---|---|---|---|---|
| 1312 | 321 | 75 | 18 | 65 | 42 |

(ආ) රජයේ නිලධාරීන් සඳහා දෛනික අවසරපත් නිකුත් කිරීම. (දළ වශයෙන්)

| රජයේ නිලධාරීන්ගේ අවසරපත් | රජයේ නිලධාරීන්ගේ ගැලරි අවසරපත් | රජයේ නිලධාරීන්ගේ මැදිරි අවසරපත් | 2017 අයවැය ඉදිරිපත් කළ දින | 2017 අයවැය විවාදය වෙනුවෙන් |
|---|---|---|---|---|
| 52 | 152 | 520 | 770 | 1520 |

(ඇ) 2017 අයවැය විවාදය කාලය තුල නිකුත් කළ විශේෂ අවසරපත් (දළ වශයෙන්)

| කාර්ය මණ්ඩලයට | පොලිස් නිලධාරීන්ට | මුද්‍රණය කළ අවසරපත් |
|---|---|---|
| 88 | 67 | ගැලරි 1000<br>වාහන 600 |

(ඈ) කාර්ය මණ්ඩලයේ පෞද්ගලික වාහන අවසරපත් (දළ වශයෙන්)

| මෝටර් කාර් | යතුරුපැදි හා ත්‍රී රෝද රථ |
|---|---|
| 321 | 381 |

(ඉ) මන්ත්‍රීවරුන්ගේ රියදුරන් වෙනුවෙන් වාහන අවසරපත් 46 ක් නිකුත් කොට ඇත.

(ඊ) පුවත්පත් වාර්තාකරුවන් හා පුවත්පත් පණිවිඩකරුවන් වෙනුවෙන් පිළිවෙලින් අවසරපත් 170 හා 08 ක් නිකුත් කොට ඇත.

(උ) පාර්ලිමේන්තුව නැරඹීම පිණිස අවසරපත් නිකුත් කිරීම. (දළ වශයෙන්)

(I.) 2017 වසර තුල නිකුත් කළ මුළු ගැලරි අවසරපත් සංඛ්‍යාව - 5100

(II.) පාර්ලිමේන්තුව නැරඹීම සඳහා (කණ්ඩායමකට එක බැගින්)
නිකුත් කළ අවසරපත් (Group Passes) - 2900

(III.) නිකුත් කරන ලද තාවකාලික මාසික අවසරපත් සංඛ්‍යාව - 2276
නිකුත් කරන ලද තාවකාලික අවසරපත්වල මාසික සාමාන්‍යය - 190

(IV.) පූර්ව අවසරයකින් තොරව පාර්ලිමේන්තුව නැරඹීමට පැමිණි
පාසැල් සිසුන් හා අනෙකුත් පුද්ගලයන්ගේ සංඛ්‍යාව - 3398

4 පාර්ලිමේන්තුව අවට කලාපය තුළ ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් ආරක්ෂක නිරවුල් සහතික ලබා දීම.

නිවාස සංවර්ධනය හා ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පාර්ලිමේන්තුවේ ආරක්ෂක නිරවුල් සහතිකය ලබා ගැනීම පිණිස යොමු වී ඇති අයදුම්පත් හා අනුමැතිය ලබාදී ඇති සංඛ්‍යාව, ඊට අදාල පවත්වන ලද රැස්වීම් ආදී විස්තර පහත පරිදි වේ.

| ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව | අනුමැතිය ලබා දී ඇති අයදුම්පත් සංඛ්‍යාව | නා.ස.අධිකාරිය හා අදාල පළාත්පාලන ආයතන සමඟ පවත්වන ලද රැස්වීම් |
|---|---|---|
| 157 | 135 | 04 |

## 8 පරිපාලන දෙපාර්තමේන්තුව :

## 8.1 ආයතන කාර්යාංශය:-

පාර්ලිමේන්තු මහලේකම්වරයාගේ කාර්ය මණ්ඩලය කාර්යක්ෂම හා ප්‍රතිඵලදායක බවට පත්කරලීමේ කාර්ය උදෙසා මානව සම්පත් ප්‍රශස්ත අන්දමින් කළමනාකරණය කිරීම ආයතන කාර්යාංශයේ ප්‍රධාන වගකීම වේ. ඒ සඳහා බඳවා ගැනීම්, උසස් කිරීම් වැනි ආයතනික කාර්යයන් මෙන්ම කාර්ය මණ්ඩලයේ දැනුම, හැකියාව සහ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් පුහුණු පාඨමාලා සඳහා කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් යොමු කිරීමද සිදු කරන ලදී.

<u>පුහුණු වැඩසටහන්</u>

**(i) දේශීය පුහුණු වැඩසටහන් / පාඨමාලාවන් / දැනුවත් කිරීමේ වැඩසටහන්**

පහත සඳහන් ආයතන මගින් (බාහිරව) සහ පාර්ලිමේන්තුව තුලද ආසන්න වශයෙන් කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් 350 ක් සඳහා පුහුණු වැඩසටහන් / පාඨමාලාවන් සංවිධානය කරන ලදී.

| | |
|---|---|
| සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල | 70 |
| ප්‍රාග් ආයතනය | 02 |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය | 04 |
| ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 111 |
| British Council | 20 |
| තරුණය සංසදය | 100 |

රාජ්‍ය භාෂා පුහුණු වැඩසටහන්

| | |
|---|---|
| සිංහල භාෂා පුහුණු වැඩසටහන් | 15 |
| දෙමළ භාෂා පුහුණු වැඩසටහන් | 30 |

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

| | |
|---|---|
| පරිගණක චිත්‍රක නිර්මාණය පිළිබඳ ඩිප්ලෝමාව | 10 |
| ගුවන්තොටුපල සහ ගුවන් සේවා | 24 |

**(ii) විදේශීය පුහුණු වැඩසටහන් / අධ්‍යයන වැඩසටහන් / සම්මන්ත්‍රණ**

| | |
|---|---|
| Advance certificate course in English Language and IT proficiency (India) | - 01 |
| Seminar on Economic Cooperation for Southern Asian Countries (China) | - 01 |
| Certificate course in cloud infrastructure management (ITEC) (India) | - 01 |
| Study Programme – Legislative Assembly of Karnataka (India) | - 10 |
| Leadership Engagement and Development – I (ITEC) (India) | - 01 |
| Internship Programme for Foreign Parliamentary officials (India) | - 08 |
| Seminar on Economic Development and Financial Management for Sri Lanka (China) | - 01 |
| Legislative Drafting (India) | - 01 |
| Management Training on Natural Disaster Prevention and Relief (China) | - 01 |
| Seminar on population, sustainable Development and Poverty Reduction for Developing Countries (China) | - 01 |

<u>ආයතනික කාර්යයන්</u>

**බඳවා ගැනීම් -**

පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සඳහා නව සේවකයින් 58 දෙනෙකු බඳවා ගන්නා ලද අතර එම තනතුරු පහත සඳහන් පරිදි දක්වා ඇත.

| | |
|---|---|
| පාර්ලිමේන්තු කථා පරිවර්තක | 03 |
| තාක්ෂණ නිලධාරී | 04 |
| කමිටු වාර්තාකරු | 01 |
| සූපවේදී | 08 |
| පද්ධති සැලසුම්කරු | 01 |
| පාර්ලිමේන්තු නිලධාරී | 18 |
| ලඝු ලේඛක | 03 |
| රියදුරු | 01 |
| ගෘහ භාණ්ඩ ඔපකරු | 01 |
| ගෘහපාලන සහායක | 13 |
| භාණ්ඩ බාරගැනීමේ සහයක | 05 |

## 8.2 මන්ත්‍රී සේවා කාර්යාංශය:-

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සිය මන්ත්‍රී ධුරයන්හි කටයුතු ඉටුකිරීම සඳහා අවශ්‍ය අනුමත කරන ලද පහසුකම් සහ සේවාවන් නිසි පරිදි හා කලට වේලාවට ඔවුන් වෙත ලබා දීමට කටයුතු කිරීම සහ පාර්ලිමේන්තුවේ අදාළ අනෙකුත් අංශ මගින් ද, බාහිර අංශ මගින් ද ඒවා යථා පරිදි සැපයෙන බවට වග බලා ගැනීම මෙම අංශයේ ප්‍රධාන රාජකාරිය වේ.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නිල නිවාස සංකීර්ණය සහ නුවරඑළිය සෙන්පති නිවසේ කළමනාකරණ කටයුතු ද මන්ත්‍රී සේවා කාර්යාංශයේ විෂය පථයට අයත්වේ.

## 8.3 ප්‍රවාහන කාර්යාංශය :-

**පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සහ අනුබද්ධ කාර්ය මණ්ඩල සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම, වාහන නඩත්තුව හා අලුත් වැඩියා කටයුතු මෙම කාර්යාංශය මඟින් ඉටු කෙරේ.**

## 9 හැන්සාඩ් දෙපාර්තමේන්තුව :

2017 වර්ෂය තුළදී හැන්සාඩ් දෙපාර්තමේන්තුව ඉටු කළ කාර්ය භාරය පහත පරිදි වේ

(i) පාර්ලිමේන්තු රැස්වීම් දින 95 ක් ආවරණය කිරීම.

(ii) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE), රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (PAC), උසස් නිලතල පිළිබඳ කාරක සභාව, වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, කාන්තා සංසදය, ළමා සංසදය, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව, උපදේශක කාරක සභා (විශේෂ), ස්ථාවර කාරක සභා සහ අයවැය ඇස්තමේන්තු පිළිබඳ කාරක සභාව ඇතුළුව කාරක සභා 187ආවරණය කිරීම.

(iii) පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සියලුම රැස්වීම් ආවරණය කිරීම.

(iv) අසංශෝධිත හැන්සාඩ් වාර්තා 122ක සෝදුපත් කියවීම. ( කාණ්ඩ 245-255)

(v) සංශෝධිත හැන්සාඩ් වාර්තා 85ක් අවසාන මුද්‍රණය සඳහා යැවීම. ( කාණ්ඩ 241-247)

(vi) හැන්සාඩ් වාර්තා කාණ්ඩ 05ක් පොත් ලෙස බැඳීම සඳහා මුද්‍රණාලය වෙත යැවීම.

(vii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 12 දෙනෙකු පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා අඩංගු හැන්සාඩ් වාර්තා මුද්‍රණය සඳහා යැවීම.

(viii) කාරක සභා 104 ක වාර්තා සටහන් සංස්කරණය කිරීම.

(ix) හැන්සාඩ් වාර්තා 95කට අදාළ සූචි 08ක් සැකසීම සහ මුද්‍රණය සඳහා යැවීම. ( කාණ්ඩ 245-252)

## 10 සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව :

සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය තුල කළමණාකාරීත්වයේ උපදෙස් මත විශේෂ ව්‍යාපෘති ගණනාවක් පාර්ලිමේන්තු ලේකම් කාර්යාලය තුල හා එහි පරිශ්‍රයේද මාදිවෙල මන්ත්‍රී නිවාස සංකීර්ණයේද සිදු කරන ලදී.

| අංකය | විස්තරය | වියදම (රු.) |
|---|---|---|
| 1. | පාර්ලිමේන්තු සභා ගර් භය සඳහා ගුවන් ප්‍රචාරණ තත්ත්ව පද්ධතියක් සැපයීම, ස්ථානගත කිරීම, පරීක්ෂා කිරීම හා ක්‍රියාත්මක කොට පෙන්වීම.(Procurement of Broadcast Quality CCTV System in the main chamber) | 237,988,627.59 |
| 2. | සභා ගර්භයේ මන්ත්‍රීවරුන්ගේ මේස ලාම්පු අළුත්වැඩියාව. (Repair to the Table Stand lamps at chamber) | 730,800.00 |
| 3. | ජයන්තිපුර පිවිසුමේ ආරක්ෂක කුටිය වෙන් කිරීම හා සැකසීම. (Fabrication of a Partition for Secretary Officer's Counter at Jayanthipura Entrance) | 70,055.00 |
| 4. | පාර්ලිමේන්තුවේ පසුපස පිවිසුමේ ගේට්ටුව සැපයීම හා ඉදිකිරීම (Fabricating Supplying & Erecting of a Gate at Rear Entrance of Parliament) | 682,710.00 |
| 5. | පාර්ලිමේන්තුවේ Digital Signage පද්ධතියක් සවි කිරීම. (Supply Installation Execution & Commissioning of Digital Signage System to Parliament) | 1,669,640.31 |
| 6. | මාදිවෙල මන්ත්‍රී නිවාස සංකීර්ණයේ කසල පොම්පය සැපයීම හා සවි කිරීම. (Supply & Installation of Sewerage Pump for MP's Housing Scheme, Madiwela) | 2,445,751.00 |
| 7. | සභානායක කාර්යාලය,ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය සහ පළමු මහලේ අනෙකුත් කාර්යාල සඳහා ද්විතියික වායු සමීකරණ පද්ධතියක් සවි කිරීම. (Supply, Installation, Testing and Commissioning of Air handling unit & Secondly Chilled water pump) | 4,518,317.00 |
| 8. | Server Room හි VRF වායු සමීකරණ පද්ධතියක් සවි කිරීම. (Supply Installation, Testing & Commissioning of VRF A/C unit in Server Room) | 1,784,361.87 |
| 9. | ශීත ගබඩා කාමරය සඳහා ශීත කාරක පරිපථයක් සැපයීම හා සවි කිරීම. (Cold Room freezer Refrigeration cycle) | 858,859.88 |
| 10. | ගරු අමාත්‍යවරුන්ගේ කාමර සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම (Supply of Furniture for Minister Rooms) | 2,587,090.00 |
| 11. | මන්ත්‍රීවරුන්ගේ පුද්ගලික භෝජනාගාරය තුල විශේෂ අමුත්තන් සඳහා කොටසක් වෙන් කිරීම (Partitioning of Member's Private Dining) | 2,171,856.00 |
| | මුළු වියදම | 255,508,068.65 |

## 11 තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව :

2017 වර්ෂයේදී තොරතුරු පද්ධති සහ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්අතර තොරතුරු සහ සන්නිවේදන යටිතල ව්‍යුහය නඩත්තු කිරීම, ආයතනයේ විවිධ අංශ වල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම පිණිස මූල්‍ය කළමනාකරණ, පොදු ව්‍යාපාර සහ රාජ්‍ය ගිණුම් කාරක සභා සඳහා තොරතුරු කළමනාකරණ, භෝජනාගාර කළමනාකරණ, සකසුරුවම් සමිතියේ කළමනාකරණය, අමුත්තන්ගේ පැමිණීමේ තොරතුරු කළමනාකරණය සඳහා පද්ධතීන් ඇති කිරීම,ගෘහස්ථ යෙදුම් වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම, නඩත්තු සේවා ගිවිසුම් පිළිබඳව කටයුතු කිරීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම, පාර්ලිමේන්තු වෙබ් අඩවිය නඩත්තු කිරීම, තොරතුරු ආපදා කළමනාකරණය පද්ධති අධීක්ෂණය කිරීම යනාදී කටයුතු ප්‍රධාන ස්ථානයක් ගෙන ඇත.

## 12 අභ්‍යන්තර විගණන කාර්යාංශය :-

2017 වර්ෂය තුළ පහත සඳහන් ක්ෂේත්‍රවල පවතින ක්‍රියාකාරකම් අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය කරන ලදී.

**විගණන හා කළමනාකරණ කමිටුව**

අංක PF / PE / 7 හා 2000.03.15 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් ඇතුළු රාජ්‍ය සම්පත් කාර්යක්ෂමව යොදා ගැනීම අරමුණු කරගෙන විගණන හා කළමනාකරණ කමිටුව පාර්ලිමේන්තුව තුළ ස්ථාපිත කරන ලදී.

පහත සඳහන් පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් වර්ෂය තුළ පවත්වා ඇත.

| රැස්වීම | රැස්වීම පැවැත්වූ දිනය | භාණ්ඩාගාර- -යට කාර්ය සටහන් යවනු ලැබුවේද? | රැස්වීමේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබුවේද? | ගනු ලැබූ තීරණ සම්බන්ධයෙන් පසු විපරම් කරනු ලැබුවේද? |
|---|---|---|---|---|
| 1 වන කාර්තුව | 29.03.2017 | ඔව් | ඔව් | ඔව් |
| 2වන කාර්තුව | 30.06.2017 | ඔව් | ඔව් | ඔව් |
| 3වන කාර්තුව | 25.10.2017 | ඔව් | ඔව් | ඔව් |
| හතර වන කාර්තුව | 14.12.2017 | ඔව් | ඔව් | ක්‍රියාත්මක වෙමින් පවතී. |

විගණන හා කළමනාකරණ කමිටුව විසින් ගන්නා ලද පහත සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම

- පාර්ලිමේන්තුවේ සියලු කාර්යාලවල භාවිතා කරන ලිපි ශීර්ෂයන් සඳහා එකම ආකෘතියක් අනුගමනය කිරීමට තීරණය කර ඇත.
- පාර්ලිමේන්තුව පරිහරණය කරන ඉඩම් නීත්‍යානුකූලව අත්පත් කර ගැනීම සහ ඒ සඳහා ඔප්පු ලබා ගැනීමට කටයුතු කර ඇත.

  විගණන හා කළමනාකරණ කමිටුව විසින් ලබා දී ඇති උපදෙස්වලට අනුව පාර්ලිමේන්තුව විසින් පරිහරණය කරනු ලබන ඉඩම් නීත්‍යානුකූලව අත්පත් කර ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරන ලද විශේෂ කමිටුව විසින් කටයුතු කර ඇත. මේ සඳහා මහනගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා කැබිනට් අනුමැතිය ලබා දී ඇත.

  නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත් සෙන්පති නිවස පිහිටි භූමියට අදාල පැවරීමේ ලේඛණය සහ දැනට හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට භාරදී ඇති, නිවාස සංවර්ධන අධිකාරියෙන් ලබා ගත් ජයවඩනගම පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල නිවාස 15හි ඔප්පු ලබා ගැනීම සඳහා අභ්‍යන්තර විගණන කාර්යාංශය මැදිහත් වී ඇත.

## 13 විදේශ සබඳතා සහ සන්ධාන කාර්යාංශය :

2017 වර්ෂයේදී විදේශ සම්බන්ධතා හා සන්ධාන කාර්යාංශය විසින් ප්‍රධාන වශයෙන් පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය, අන්තර් පාර්ලිමේන්තු සංගමය සහ සාර්ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය යන සංගම්වලට අදාළ සියලුම කාර්යයන් සහ සේවාවන් ඉටු කරන ලදී.

මෙහිදී පහත දැක්වෙන සමුළු, වැඩමුළු, සංචාර, රැස්වීම්, අධ්‍යයන චාරිකා යනාදියට අදාළ සියලුම කටයුතු සංවිධානය කරන ලදී.

- පොදු රාජ්‍ය මණ්ඩලීය කාන්තා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සමුළුව - එක්සත් රාජධානිය, 2017 පෙබරවාරි 24 සිට 27 දක්වා
- පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග හා කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් වූ පොදු රාජ්‍ය මණ්ඩලීය වැඩමුළුව, දකුණු අප්‍රිකාව, 2017 මැයි 21 සිට 28 දක්වා
- ජාතික ආරක්ෂාව හා සයිබර් ආරක්ෂා දිනය සම්බන්ධ ජාත්‍යන්තර පාර්ලිමේන්තු සම්මන්ත්‍රණය, එක්සත් රාජධානිය, 2017 මාර්තු 27 සිට 31 දක්වා
- නූතන වහල්භාවය සම්බන්ධයෙන් වන ආසියා ශාන්තිකර කලාපීය වැඩමුළුව, එක්සත් රාජධානිය , 2017 අප්‍රේල් 25 සිට 28 දක්වා
- ජාතික අර්බුද සඳහා ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් වූ රාජ්‍ය ගිණුම් කාරක සභා මගින් ඇති කරන ලද අධ්‍යයන කණ්ඩායම් වැඩමුළුව, කැනඩාව , 2017 ජුලි 12 සිට 15 දක්වා
- 14 වෙනි කැනේඩියානු පාර්ලිමේන්තු සමුළුව, 2017 ඔක්තෝම්බර් 15 සිට 21දක්වා
- 63 වෙනි පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සම්මන්ත්‍රණය, ඪකා, බංගලාදේශය 2017 නොවැම්බර් 04 සිට 08 දක්වා

- ලාදුරු රෝගයට භාජනය වූ පුද්ගලයින් සම්බන්ධ ගෝලීය වැඩමුළුව, ඉන්දියාව, 2017 ජනවාරි 29 සිට 31 දක්වා
- තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගැනීම බලාපොරොත්තුව සම්බන්ධයෙන් වූ දකුණු ආසියානු කතානායකවරුන්ගේ සැසිවාරය, ඉන්දොර්, ඉන්දියාව , 2017 පෙබරවාරි 17 සිට 21 දක්වා
- ඉරාන පාර්ලිමේවන්තුව මගින් සංවිධානය කරන පලස්තීන ජනතාවට සහයෝගය දැක්වීම සම්බන්ධයෙන් වූ 6 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය,ඉරානය , 2017 පෙබරවාරි 20 සිට 24 දක්වා
- ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ධූත පිරිසේ ඉරාන නිල සංචාරය, ඉරානය , 2017 මාර්තු 03 සිට 06 දක්වා
- ආසියානු පාර්ලිමේන්තු සංගමයේ දේශපාලන කටයුතු හා ආසියානු පාර්ලිමේන්තුවක් නිර්මාණය කරීම සඳහා වූ විශේෂ ස්ථාවර කමිටුවේ රැස්වීම,ඉස්ලාමාබාද්, පකිස්ථානය , 2017 මාර්තු 13 සිට 17 දක්වා
- 136 වැනි අන්තර් පාර්ලිමේන්තු සැසිවාරය සහ ඒ හා අදාල රැස්වීම්,ඪකා,බංගලාදේශය, 2017 මාර්තු 30 සිට අප්‍රේල් 06 දක්වා
- ආසිය ශාන්තිකර කලාපීය යොවුන් පාර්ලිමේන්තු නියෝජිතයින්ගේ සමුළුව, ශ්‍රී ලංකාව, 2017 අප්‍රේල් 24 සිට 28 දක්වා
- අන්තර් පාර්ලිමේන්තු සංගමයේ සැකැස්ම හා ක්‍රියාකාරිත්වය සම්බන්ධ තොරතුරු සමුළුව, ස්විට්සර්ලන්තය, 2017 මැයි 15 සිට 21 දක්වා
- ජාත්‍යන්තර වෙළදාම සම්බන්ධයෙන් වූ පාර්ලිමේන්තු නියෝජිතයින්ගේ වැඩමුළුව, සිංගප්පූරුව, 2017 මැයි 15 සිට 17 දක්වා
- ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ධූත පිරිසේ චීන නිල සංචාරය, චීනය, 2017 ජුනි 13 සිට 19 දක්වා
- පාර්ලිමේන්තු කමිටුවල කාර්යය හා කාර්යක්ෂමතාව අධ්‍යයන සම්බන්ධ වූ වැඩසටහන, ජර්මනිය, 2017 ජුනි 25 සිට ජුලි 01 දක්වා
- ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ධූත පිරිසේ චීන නිල සංචාරය, චීනය, 2017 සැප්තැම්බර් 09 සිට 17 දක්වා
- 137 වැනි අන්තර් පාර්ලිමේන්තු සමුළුව හා ඒ සම්බන්ධ රැස්වීම්, රුසියාව, 2017 ඔක්තෝම්බර් 13 සිට 20 දක්වා

- තිරසාර සංවර්ධනය සම්බන්ධයෙන් වූ ලෝක පාර්ලිමේන්තු සැසිය, බාලි, ඉන්දුනීසියාව, 2017 සැප්තැම්බර් 06 සිට 07 දක්වා
- නායයෑම් අවම කර ගැනීම සම්බන්ධ සමුළුව, කුන්මින්,චීනය, 2017 අගෝස්තු 13 සිට 21 දක්වා
- ඕමාන් රාජ්‍ය සභාවේ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඕමාන් ධූත පිරිසේ නිල සංචාරය, ශ්‍රී ලංකාව, 2017 දෙසැම්බර් 4 සිට 8 දක්වා

- දකුණු ආසියා පාර්ලිමේන්තු නියෝජිතයින්ගේ ළමුන් සම්බන්ධ සැසිවාරය, කත්මණ්ඩු, නේපාලය, 2017 මාර්තු 02 සිට 03 දක්වා
- සමාජ සාධාරණත්වය හා ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා කාන්තා පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ කාර්ය භාරය සම්බන්ධයෙන් කලාපීය සම්මන්ත්‍රණය, ඉස්ලාමාබාද්, පකිස්ථානය, 2017 මාර්තු 11 සිට 16 දක්වා
- 8 වැනි සාර්ක් රටවල කතානායකවරුන්ගේ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සම්මන්ත්‍රණය, ශ්‍රී ලංකාව, 2017 ඔක්තෝම්බර් 03 සිට 07 දක්වා

පාර්ලිමේන්තු මිත්‍ර සංගම්වලට අදාළ කටයුතු (දැනට සංගම් 54 ක් ඇත.)

පොදු රාජ්‍ය මණ්ඩලීය සංගමය, අන්තර් පාර්ලිමේන්තු සංගමය සහ සාර්ක් පාර්ලිමේන්තු සංගමය මගින් පාර්ලිමේන්තු නිලධාරීන් සඳහා සංවිධානය කරන ලද විවිධ අධ්‍යයන චාරිකා සම්බන්ධ කටයුතු.

කථානායකතුමා නියෝජ්‍ය කථානායකතුමා සහ නියෝජ්‍ය කාරක සභාපතිතුමා හමුවීමට පැමිණි විවිධ රාජ්‍ය නියෝජිත කණ්ඩායම්වලට අදාළ සත්කාර සහ මාධ්‍ය කටයුතු

මැති ඇමතිවරුන්ගේ විදේශ ගමන්වලට අදාල වීසා, ගමන් බලපත්‍ර සහ ගුවන් තොටුපළ විශේෂ අමුත්තන්ගේ පර්යන්තය වෙන්කිරීමේ කටයුතු සහ ගුවන් තොටුපළ රාජකාරී.


ORGANIZATION CHART OF PARLIAMENT OF SRI LANKA
SECRETARY GENERAL OF PARLIAMENT
CHIEF OF THE STAFF AND DEPUTY SECRETARY GENERAL OF PARLIAMENT
ASSISTANT SECRETARY GENERAL OF PARLIAMENT (ADMINISTRATION SERVICES)
ASSISTANT SECRETARY GENERAL OF PARLIAMENT (LEGISLATIVE SERVICES)
N
L
K
J
IA
I
H
G
F
E
D
C
B
A
SERJEANT-AT-ARMS
DIRECTOR ADMINISTRATION
DIRECTOR FINANCE
CO-ORDINATING ENGINEER
DIRECTOR (C & HKS)
DIRECTOR INFORMATION SYSTEMS & MANAGEMENT
DIRECTOR LEGISLATIVE SERVICES
EDITOR OF HANSARD
LIBRARIAN
PRINCIPAL OFFICER
DEPUTY PRINCIPAL OFFICER
TRANSPORT OFFICER
PARLIAMENTARY INTERPRETER
HANSARD REPORTER
HANDYMAN
COOK
LIBRARY ASSISTANT
LIBRARY ATTENDANT